# හින්දි භාෂාව

## ගුරු මාර්ගෝපදේශය

## 11 ශ්‍රේණිය

සම්භාව්‍ය, විදේශ භාෂා හා ද්විභාෂා අධ්‍යාපන දෙපාර්තමේන්තුව

ජාතික අධ්‍යාපන ආයතනය

ශ්‍රී ලංකාව

හින්දී භාෂාව

ගුරු මාර්ගෝපදේශය

11 ශ්‍රේණිය

ප්‍රථම මුද්‍රණය - 2016

© ජාතික අධ්‍යාපන ආයතනය

ISBN

සම්භාව්‍ය, විදේශ භාෂා හා ද්විභාෂා අධ්‍යාපන දෙපාර්තමේන්තුව

ජාතික අධ්‍යාපන ආයතනය

ශ්‍රී ලංකාව

*වෙබ් අඩවිය www.nie.lk*

*විද්‍යුත් තැපැල :info@nie.lk*

මුද්‍රණය

ජාතික අධ්‍යාපන ආයතනය

## අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවිඩය

ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිර්දේශ කරන ලද ජාතික මට්ටමේ නිපුණතා සංවර්ධනය කිරීමේ මූලික අරමුණ සහිත ව එවකට පැවති අන්තර්ගතය පදනම් වූ අධ්‍යාපනය වෙනුවට වර්ෂ අටකින් යුතු චක්‍රයකින් සමන්විත නව නිපුණතා පාදක විෂයමාලාවෙහි පළමු අදියර, වර්ෂ 2007 දී ශ්‍රී ලංකාවේ ද්විතීයික අධ්‍යාපන ක්ෂේත්‍රයට හඳුන්වා දෙන ලදි.

නව විෂයමාලා චක්‍රයේ දෙවන අදියර 2016 වර්ෂයේ දී හත්වන සහ එකොළොස්වන ශ්‍රේණි සඳහා හඳුන්වා දීම කළ යුතු ව තිබේ. මේ සඳහා පර්යේෂණවලින් අනාවරණය වූ කරුණු ද අධ්‍යාපනය පිළිබඳ ව අවධානය යොමු කරන විවිධ පාර්ශවයන්ගේ යෝජනා ද පදනම් කොට ගෙන විෂය නිර්දේශ තාර්කීකරණය කිරීමේ ක්‍රියාවලියක් ජාතික අධ්‍යාපන ආයතනය විසින් හඳුන්වා දෙනු ලැබීය.

මෙම තාර්කීකරණ ක්‍රියාවලියේ දී සියලු ම විෂයයන්ගේ නිපුණතා මට්ටම්, පදනම් මට්ටමේ සිට උසස් මට්ටම දක්වා ක්‍රමානුකූල ව ගොඩ නැඟීම සඳහා පහළ සිට ඉහළට ගමන් කරන සිරස් සංකලනය භාවිත කරන ලදි. විවිධ විෂයයන්හි දී එක ම විෂය කරුණු නැවත නැවත ඉදිරිපත්වීම හැකිතාක් අවම කිරීම, වැඩි බර පැටවීම් වලින් යුක්ත විෂය අන්තර්ගතයන් අඩු කිරීම, සහ ක්‍රියාත්මක කළ හැකි ශිෂ්‍ය මිතුරු විෂයමාලාවක් සැකසීම සඳහා තිරස් සංකලනය භාවිත කර ඇත.

ගුරු භවතුන් සඳහා පාඩම් සැලසුම් කිරීම, ඉගැන්වීම, ක්‍රියාකාරකම් කරගෙන යෑම, මැනීම් හා ඇගයීම් යනා දී අංශයන් සඳහා අවශ්‍ය වන්නා වූ මාර්ගෝපදේශයන් ලබාදීමේ අරමුණින් මෙම නව ගුරු මාර්ගෝපදේශය හඳුන්වා දී ඇත. පංති කාමරය තුළ දී වඩාත් ඵලදායී ගුරුවරයෙකු ලෙස කටයුතු කිරීමට මෙම මාර්ගෝපදේශයන් උපකාර වනු ඇත. සිසුන්ගේ නිපුණතාවන් වර්ධනය කිරීම සඳහා ගුණාත්මක යෙදවුම් හා ක්‍රියාකාරකම් තෝරා ගැනීමට ගුරුවරුන්ට අවශ්‍ය නිදහස මෙමගින් ලබා දී තිබේ. එමෙන් ම නිර්දේශිත පාඨ ග්‍රන්ථවල ඇතුළත් වන විෂය කරුණු පිළිබඳ ව වැඩි බර තැබීමක් මෙම ගුරු මාර්ගෝපදේශවල අන්තර්ගත නොවේ. එම නිසා මෙම ගුරු මාර්ගෝපදේශය වඩාත් ඵලදායී වීමට නම් අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින් සකසා ඇති අදාළ පාඨ ග්‍රන්ථ සමග සමගාමී ව භාවිත කිරීම අත්‍යවශ්‍ය වේ.

තාර්කීකරණය කරන ලද විෂය නිර්දේශ, නව ගුරු මාර්ගෝපදේශ හා අලුතින් සංවර්ධනය කර ඇති පාඨ ග්‍රන්ථවල මූලික අරමුණු වන්නේ ගුරු කේන්ද්‍රීය අධ්‍යාපන රටාවෙන් සිසු කේන්ද්‍රීය අධ්‍යාපන රටාවක් හා වඩාත් ක්‍රියාකාරකම් මත පදනම් වූ අධ්‍යාපන රටාවකට වෙනස්වීම මගින් වැඩ ලෝකයට අවශ්‍ය වන්නා වූ නිපුණතා හා කුසලතාවන්ගෙන් යුක්ත මානව සම්පතක් බවට ශිෂ්‍ය ප්‍රජාව සංවර්ධනය කිරීමය.

මෙම ගුරු මාර්ගෝපදේශය සම්පාදනය කිරීමේ දී ජාතික අධ්‍යාපන ආයතනයේ ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලය ද ආයතනයේ සභාව ද නන් අයුරින් දායකත්වය ලබා දුන් සියලු ම සම්පත්දායකයන් හා අනිකුත් පාර්ශවයන්ගේ ඉමහත් කැපවීම ඇගැයීමට ද මෙය අවස්ථාවක් කර ගනු කැමැත්තෙමි.

**අධ්‍යක්ෂ ජනරාල්**

**ජාතික අධ්‍යාපන ආයතනය**

## නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්  හිමිගේ පණිවිඩය

ඉගෙනුම, පුළුල් ක්ෂේත්‍රයක විහිද යන්නකි.  එය ජීවිත අතිමහත් බවට ද, ඉතා ම සරල බවට ද පත්කරයි. මනුෂ්‍යයා ඉගෙනුම් කුසලතාවෙන් උත්කෘෂ්ට ය.  මානව සමාජ සංවර්ධනය කේන්ද්‍ර  කොට ගත් රටක්, සමාජයක් බුද්ධිය විසින් හඳුනාගත් අසම්මතයන් බැහැර කිරීමට ද සුභාවිතයන් තුළින් නව ලොවක් නිර්මාණය කර ගැනීමට ද මෙවලම කරගනු ලබන්නේ ඉගෙනුමයි.

ඉගෙනුම සඳහා වටිනා යමක් ද, ඉගෙනුම් ක්‍රමවේදයන් හා පහසුකම් ද අධ්‍යාපනය වටා නිර්මාණය විය යුතු ය.  විෂය මාලාව, විෂය නිර්දේශ, මාර්ගෝපදේශ, සුසාධ්‍යකරුවන් ඉගෙනුම් ක්ෂේත්‍රයට එක්වනුයේ මේ ආකාරයෙනි.

නූතන ශ්‍රී ලංකාව ගෝලීය ප්‍රවණතාවන් මෙන් ම පුරාතන උරුමයන් ද සම්මිශ්‍රණය කර ගනිමින් ස්වීය අධ්‍යාපන රටාවක් හිමි කරගෙන ඇත.  කාලීන අවශ්‍යතා මත ප්‍රතිසංස්කරණයන් තුළින් වසර අටකට වරක් යාවත්කාලීන වන විෂය මාලාවේ ඉගෙනුම් සම්පතක් ලෙස මෙම ගුරු මාර්ගෝපදේශ නිර්මාණය වේ.

විෂයයෙහි අරමුණුවල සංගතතාව ජාතික මට්ටමින් පවත්වාගත යුතු ය.  එහෙත් ගුරු මාර්ගෝපදේශයන්හි  ඉගෙනුම් ක්‍රමවේදයන්, අකුරක්වත් වෙනස් නොකොට පිළිපැදිය යුත්තක් නම් නොවේ. විෂය නිර්දේශයෙහි නිපුණතා, නිපුණතා මට්ටම්, සාධනය වීම සඳහා විෂය අන්තර්ගතය තුළින් ඉගෙනුම් පල සම්ප්‍රාප්තිය පිණිස ඉගෙනුම් ක්‍රමවේද නිර්මාණශීලී ව වෙනස්කර ගැනීමට සුසාධ්‍යකරුවන්ට පැහැදිලිව ම ඉඩක් ඇති බව සඳහන් කරමි.  ශිෂ්‍ය සාධන ප්‍රතිශතය ඉහළ මට්ටමකට ගැනීම සඳහා උදව් වන, පහසුකම් සලසන ගුරු භූමිකාවට කිසියම් ප්‍රවේශයක් සඳහා නිර්මාණය වන ගුරු මාර්ගෝපදේශ ශික්ෂකයාහට ද දෙගුරුනට ද භාවිත කළ හැක.  අදාළ පෙළ පොතට සහකරුවකු වන ගුරු මාර්ගෝපදේශය තවත් පෙළ පොතක් නොවන බව දැන ගුරුභවතුන් ගුරු මාර්ගෝපදේශ හා අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ සම්පාදිත අදාළ පෙළ පොත යන සම්පත් ද්‍රව්‍ය දෙක ම භාවිත කළ යුතු ය.

ඒ ඒ විෂයයන්හි සාධනය පිළිබඳ ඇගැයීම් සිදුකරන ජාතික මට්ටමේ පරීක්ෂකවරයෙකු වුව ද අපේක්ෂා කරන සාධනයන්, විෂය ඉගැන්වීමට මග පෙන්වන සුසාධ්‍යකරුවන් විසින් පාඩම අවසානයෙහි පන්ති කාමරයේ  දී දරුවන් සමග ප්‍රත්‍යක්ෂකරණයට පත්විය යුතු ය.  එම ඒකාත්මික වීම සඳහා වූ ප්‍රබෝධාත්මක සංස්කෘතියක් ගොඩනගා ගැනීමට ගුරු මාර්ගෝපදේශය පහුරක්, යාත්‍රාවක් කරගනු ඇතැයි ආයාචනා පූර්වක ව අපේක්ෂා කරමි.

**පීඨාධිපති, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්**
**භාෂා මානව ශාස්ත්‍ර හා සමාජවිද්‍යා පීඨය**
**ජාතික අධ්‍යාපන ආයතනය.**

# විෂයමාලා කමිටුව

උපදේශකත්වය හා අනුමැතිය - ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලය, ජාතික අධ්‍යාපන ආයතනය.

විෂය සම්බන්ධීකරණය - ඊ.එම්. තනුජා ගීතානි ජයතිලක මිය,
සහකාර කථිකාචාර්ය,
ජාතික අධ්‍යාපන ආයතනය.

විෂය සංස්කරණය - මහාචාර්ය උපුල් රංජිත් හේවාවිතානගමගේ,
අධ්‍යයනාංශ ප්‍රධාන, හින්දී අධ්‍යයනාංශය,
කැලණිය විශ්වවිද්‍යාලය.

ලේඛක මණ්ඩලය - **බාහිර**

01. මාහාචාර්ය ලක්ෂ්මන් සෙනෙවිරත්න,
පීඨාධිපති, මානව ශාස්ත්‍ර පීඨය,
කැලණිය විශ්වවිද්‍යාලය.

02. අනූෂා නිල්මිණී සල්වතුර මිය,
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, හින්දී අධ්‍යයනාංශය,
කැලණිය විශ්වවිද්‍යාලය.

03. නිලන්ති රාජපක්ෂ මිය,
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, භාෂා හා සංස්කෘතික අධ්‍යයනාංශය,
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය.

04. නීතා සුභාෂිණී සෙනෙවිරත්න මිය,
කථිකාචාර්ය, හින්දී අධ්‍යයනාංශය,
කැලණිය විශ්වවිද්‍යාලය.

05. බ්‍රසිල් නාගොඩවිතාන මයා,
කථිකාචාර්ය, භාෂා අධ්‍යයනාංශය,
සබරගමුව විශ්වවිද්‍යාලය.

06. ආර්.ජේ.කේ. අනෝමා මිය,
ගම්පහ බණ්ඩාරනායක විද්‍යාලය.

07. ඩබ්.එම්. මාධවී ඩී ජයරත්න මිය,
කු/ මලියදේව බාලිකා විද්‍යාලය.

**අභ්‍යන්තර**

01. ඊ.එම්. තනුජා ගීතානි ජයතිලක මිය,
සහකාර කථිකාචාර්ය,
ජාතික අධ්‍යාපන ආයතනය.

පරිගණක වදන් සැකසුම එස්. ඩී. සමරක්කොඩි මිය,
ජාතික අධ්‍යාපන ආයතනය.

# ගුරු මාර්ගෝපදේශය පරිශීලනය සඳහා උපදෙස්

2007 නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණය යටතේ පාසල් පද්ධතියට හඳුන්වා දී ඇති නිපුණතා පාදක විෂය මාලාව පාසල් අධ්‍යාපනයේ පූර්ණ පරිවර්තනයක් ඇතිවන ආකාරයෙන් සැලසුම් කර තිබේ. නිපුණතාවක් යනු දැනුම (Knowledge), කුසලතා (Skills) , ආකල්ප (Attitudes), පෞද්ගලික හා සාමාජීය හැකියා (Personal & Social Abilities) යන මේ සංරචකවලින් සමන්විත වූවකි. ඒ අනුව වැඩ කරන හෝ ඉගන ගන්නා තත්ත්වයන් තුළ දැනුම, කුසලතා, ආකල්ප, පෞද්ගලික හා සාමාජීය හැකියා යොදාගැනීමට ඇති කුසලතාව නිපුණතාවක් ලෙස හැඳින්විය හැකි ය.

හින්දී  විෂය නිර්දේශය ද නිපුණතා පාදක වූවකි. පාසල් සිසුන්ගේ චින්තන කුසලතා, පුද්ගල කුසලතා හා සමාජ කුසලතා ද ගොඩ නැගීමේ  අරමුණෙන් පාසල් තුළ හින්දී භාෂාව ඉගැන්වීම කළ යුතු වේ. ඒ වෙනුවෙන් සැකසුණු නිපුණතා පාදක විෂය නිර්දේශයට අනුව මෙම ගුරු මාර්ගෝපදේශය නිර්මාණය කොට ඇත. එහි දී විෂය භාර ගුරු භවතා විසින් පහත සඳහන් කරුණු කෙරෙහි අවධානය යොමුකොට ඉගැන්වීම් ක්‍රියාවලියෙහි යෙදිය යුතු වේ.

11 ශ්‍රේණිය සඳහා නිපුණතා 8 ක් හා ඒ ඒ නිපුණතාවට අදාළ නිපුණතා මට්ටම් විෂය නිර්දේශයේ ඇතුළත් වේ. එහි 1,2 යන නිපුණතා හින්දී භාෂාවේ නිවැරදි උච්චාරණය සහ නිවැරදි ලේඛනය සඳහා ශිෂ්‍යයා හුරු කරවයි. 3,4 යන නිපුණතා තුළින් හින්දී භාෂාව ශ්‍රවණයෙන් අර්ථය අවබෝධ කරගෙන ප්‍රතිචාර දක්වීමේ හැකියාව ද හින්දී භාෂාව සරලව කථා කිරීමේ හැකියාව ද ශිෂ්‍යයා තුළ ඇති කරයි. 5 වන නිපුණතාව හින්දී භාෂාව හා සම්බන්ධ ව්‍යාකරණ පිළිබඳ මූලික අවබෝධය ශිෂ්‍යයා තුළ ඇති කරයි. 6 වන නිපුණතාව මගින් හින්දියෙන් ගණන් කිරීමේ හැකියාව ලබා දෙයි.  7 වන නිපුණතාව මගින් හින්දී ගද්‍ය පාඨ කියවා අර්ථය අවබෝධ කර ගැනීමේ හැකියාව ශිෂ්‍යයා තුළ ඇති කරයි.  8 වන නිපුණතාව ශිෂ්‍යයා තුළ පරිවර්තන හැකියාව ඇති කරයි. ගුරුවරයාට ඉගැන්වීමේ පහසුව සඳහා ද, ශිෂ්‍යයාට ඉගෙන ගැනීමේ පහසුව සඳහා ද, පරිශීලන ග්‍රන්ථ ආධාර කර ගත හැකි ය. පන්ති කාමර අධ්‍යාපනය මෙන් ම ක්ෂේත්‍ර අධ්‍යාපනය ද මෙහි දී යොදා ගත යුතු අතර තාක්ෂණික ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය ද භාවිතයට ගැනීම අවශ්‍ය වේ. ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී හා පාඩම් සැලසුම්කරණයේ දී ඉගෙනුම් පල ගුරුවරයාට බෙහෙවින් ප්‍රයෝජනවත් වේ. ඉගෙනුම් පල යනු යම් පාඩමක් ඉගෙන ගැනීමෙන් අනතුරුව සිසුවා සාධනය කර ගනී යැයි අපේක්ෂිත ප්‍රතිඵලය යි. ගුණාත්මක යෙදවුම්, පාඩමේ සංවර්ධනය සඳහා ද ඉගෙනුම් ක්‍රියාවලියේ ඒකාකාරී, නීරස බව ඉවත් කරමින් එහි  ප්‍රතිඵලදායක වර්ධනයක් ඇති කිරීම සඳහා ද පිටුවහල් කර ගත හැක. පන්ති කාමර ඉගෙනුම් ක්‍රියාවලිය සාර්ථක ව සිදු වන්නේ දැයි සොයා බැලීම  ගුරුවරයාගේ ප්‍රධාන වගකීමක් වන අතර, එයට තක්සේරුව හා ඇගයීම ගුරුවරයාට ප්‍රයෝජනවත් වේ. එමගින් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ සාර්ථකත්වය මෙන් ම ගුරු සිසු අන්‍යෝන්‍ය සබඳතාව ද තහවුරු වේ.

නිපුණතා හා නිපුණතා මට්ටම් කෙරෙහි සැලකිලිමත් වෙමින් විෂය අන්තර්ගතය කෙරෙහි දැඩි අවධානය යොමුකොට අපේක්ෂිත ඉගෙනුම් පල පාඩම අවසානයේ දී ශිෂ්‍යයා තුළින් ප්‍රකට වන පරිදි ඉගැන්වීම් ක්‍රියාවලියේ නියුක්ත විය යුතු ය. සෑම නිපුණතා මට්ටමක් සඳහා ම අදාළ විෂය කරුණුවල සංක්ෂිප්තය ලබා දී ඇති අතර යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමයක් දක්වා ඇත. පන්ති කාමරයට උචිත පරිදි වඩාත් නිර්මාණශීලී ක්‍රමයක් භාවිත කිරීමට ගුරුවරයාට මෙහි දී නිදහස හිමි වේ. මෙහි කාලච්ඡේද ගණනය කර ඇත්තේ විෂය අන්තර්ගතය පිළිබඳ සැලකිලිමත් වෙමිනි. වර්ෂයට නියමිත කාලච්ඡේද සංඛ්‍යාව නොඉක්මවන පරිදි නිපුණතාවන්ට වෙන්කර ඇති කාලච්ඡේද ප්‍රමාණ සංශෝධනය කරගැනීමට ගුරුවරයාට නිදහස ඇත. තක්සේරුව හා ඇගයීම් වැඩපිළිවෙළ, ලබා දී ඇති නිර්ණායක පදනම්කොට ගනිමින් ඒවා

ශිෂ්‍යයා තුළින් ප්‍රකටකොට ගැනීම සඳහා ඉගැන්වීම් කාර්යයේ මුල සිට අග දක්වා ම සිදුකළ හැකි ය. සිසුන්ගේ හැකියා නොහැකියා අනුව ඉදිරිපෝෂණය හා ප්‍රතිපෝෂණය ලබා දිය යුතු ය.

නිපුණතා පාදක අධ්‍යාපනයේ දී සාම්ප්‍රදායික ගුරු භූමිකාවේ පැහැදිලි වෙනසක් අපේක්ෂා කෙරේ. සාම්ප්‍රදායිකව භාවිත කළ දේශන ක්‍රමය පදනම් කරගත් සම්ප්‍රේෂණ ගුරු භූමිකාව වෙනුවට ගවේෂණයේ යෙදීමට සිසුවාට ඉඩ සලසමින් සිසු විභවතා මතු කර ගැනීමට සමත් පරිණාමන ගුරු භූමිකාවක අවශ්‍යතාව පැන නැගී ඇත. එබැවින් සාම්ප්‍රදායික පන්ති කාමර, ගුරු කේන්ද්‍රීය අධ්‍යාපනයෙන් මිදී ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපනය තුළ සිසුවා වෙත සමීප වීමටත් නවීන තාක්ෂණය ද ප්‍රයෝජනයට ගනිමින් සාර්ථක ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියක නිරත වීමට ගුරුවරයා මග පාදා ගත යුතු ය.

විෂය නිර්දේශයේ ඇතුළත් නිපුණතාවලට අදාළ විෂය අන්තර්ගතය ඇසුරින් නිපුණතා මට්ටම් සාක්ෂාත් වන පරිදි ඉගැන්වීම් ක්‍රියාවලියේ යෙදී ඉගෙනුම් පල අත්පත් කර ගත යුතු අතර, ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය ගුරු ස්වාධීනත්වය අනුව නිර්මාණාත්මකව සිදු කර ගත යුතු ය.

**ව්‍යාපෘති නායක**

# පටුන


| | | පිටු අංක |
|---|---|---|
| 01 | අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවිඩය | iii |
| 02 | නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් හිමිගේ පණිවිඩය | iv |
| 03 | විෂයමාලා කමිටුව | v |
| 04 | ගුරු මාර්ගෝපදේශය පරිශීලනය සඳහා උපදෙස් | vi |
| 05 | පටුන | viii |
| 06 | විෂය නිර්දේශයේ අන්තර්ගතය | ix-xxiv |
| 07 | ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස් | xxv |
| 08 | නිපුණතාව 1 | 01 |
| 09 | නිපුණතාව 2 | 02 |
| 10 | නිපුණතාව 3 | 03 |
| 11 | නිපුණතාව 4 | 04 |
| 12 | නිපුණතාව 5 | 05-12 |
| 13 | නිපුණතාව 6 | 13-15 |
| 14 | නිපුණතාව 7 | 16-17 |
| 15 | නිපුණතාව 8 | 18 |
| 16 | ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය ප්‍රවර්ධනය කිරීමේ නිදර්ශක ආධාරකය | 19-20 |

# හින්දි

# විෂය නිර්දේශය

# 11 ශ්‍රේණිය

## 01. විෂය හැඳින්වීම

හින්දී භාෂාව අපගේ අසල්වැසි රට වන ඉන්දියාවේ රාජ්‍ය භාෂාවයි. එය උතුරු ඉන්දියාවේ ජනගහනයෙන් අඩකට වඩා වැඩි සංඛ්‍යාවකගේ මව්බස ද වේ. ඊට අමතර ව සූරිනාම්, ෆිජී, ගයානා, ට්‍රිනිඩෑඩ් සහ මැදපෙරදිග රටවල ද බහුල වශයෙන් ව්‍යවහාර වේ .විදේශ භාෂාවක් ලෙස ද ලෝකයේ සෑම රටක ම පාහේ හින්දී භාෂාව උගන්වනු ලැබේ.

භාෂාත්මක වශයෙන් සිංහල භාෂාවට ඇති ඥාතිත්වයත්, ආගමික, සංස්කෘතික, සාහිත්‍යයික, ආර්ථික, දේශපාලනික හා සමාජයීය සම්බන්ධතාත් හේතු කොටගෙන විදේශීය භාෂාවක් ලෙස හින්දී භාෂාව ඉගෙනීම ශ්‍රී ලාංකිකයන්ට අතිශයින් වැදගත් වෙයි. සෞන්දර්ය විෂයයන්, ඉතිහාසය, පුරාවිද්‍යාව සහ ආයුර්වේදය හැදෑරීමේ දී ද හින්දී භාෂාව, මාධ්‍ය භාෂාවක් ලෙස භාවිත කෙරෙයි. අධ්‍යාපනය සහ වන්දනාමාන කටයුතු සඳහා ඉන්දියාවට යෑමට අපේක්ෂා කරන පිරිසට හින්දී භාෂාව පිළිබඳ දැනුම මහෝපකාරී වෙයි.

විශේෂයෙන් ම ආර්ථික කටයුතුවල දී ශ්‍රී ලංකාව ඉන්දියාවට වඩාත් විවෘත වීම නිසා හින්දී භාෂාවේ වැදගත්කම සහ අවශ්‍යතාව ශ්‍රී ලාංකිකයන්ට තදින් ම දැනේ. එබැවින් ශ්‍රී ලාංකික ශිෂ්‍යයන්ට විදේශ භාෂාවක් ලෙස හින්දී භාෂාව හැදෑරීම වැදගත් වේ.

## ජාතික අරමුණු

පුද්ගලයාට හා සමාජයට අදාළ වන ප්‍රධාන ජාතික අරමුණු කරා ළඟා වීම සඳහා පුද්ගලයන්ට සහ කණ්ඩායම්වලට ජාතික අධ්‍යාපන පද්ධතියට සහාය විය යුතුය.

වසර ගණනාවක් මුළුල්ලේ ශ්‍රී ලංකාවේ ප්‍රධාන අධ්‍යාපන වාර්තා සහ ලේඛන මගින් පුද්ගල හා ජාතික අවශ්‍යතාවන් සපුරාලීම සඳහා අරමුණු නියම කරනු ලැබීය. සමකාලීන අධ්‍යාපන ව්‍යුහයන් හා ක්‍රියාවලින් තුළ දැකිය හැකි දුර්වලතා නිසා ධරණීය මානව සංවර්ධන සංකල්ප රාමුව ඇතුළත අධ්‍යාපනය තුළින් ළඟාකර ගත යුතු පහත දැක්වෙන අරමුණු ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් හඳුනා ගෙන ඇත. මෙම අරමුණු සපුරා ගැනීම අධ්‍යාපන පද්ධතිය සඳහා වූ තම ඉදිරි දැක්ම ලෙසට ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් ප්‍රත්‍යක්ෂ කොට ගෙන ඇත.

I මානව අභිමානයට ගරු කිරීමේ සංකල්පයක් මත පිහිටා ශ්‍රී ලාංකික බහුවිධ සමාජයේ සංස්කෘතික විවිධත්වය අවබෝධ කර ගනිමින් ජාතික ඒකාබද්ධතාව, ජාතික ඍජු ගුණය, ජාතික සමගිය, එකමුතුකම සහ සාමය ප්‍රවර්ධනය කිරීම තුළින් ජාතිය ගොඩනැගීම සහ ශ්‍රී ලාංකේය අනන්‍යතාව තහවුරු කිරීම.

II වෙනස් වන ලෝකයක අභියෝගයන්ට ප්‍රතිචාර දක්වන අතර ජාතික උරුමයේ මාහැගි දායාදයන් හඳුනා ගැනීම සහ සංරක්ෂණය කිරීම

ඍ.

III මානව අයිතිවාසිකම්වලට ගරු කිරීම, යුතුකම් හා වගකීම් පිළිබඳ දැනුවත් වීම, හෘදයංගම බැඳීමකින් යුතු ව එකිනෙකා කෙරෙහි සැලකිලිමත් වීම යන ගුණාංග ප්‍රවර්ධනය කිරීමට ඉවහල් වන සමාජ සාධාරණත්ව සම්මතයන් සහ ප්‍රජාතන්ත්‍රික ජීවන රටාවක් ගැබ් වූ පරිසරයක් නිර්මාණ කිරීම සහ පවත්වා ගෙන යාමට සහාය වීම.

IV පුද්ගලයන්ගේ මානසික හා ශාරීරික සුව සම්පත් සහ මානව අගයයන්ට ගරු කිරීම මත පදනම් වූ තිරසාර ජීවන ක්‍රමයක් ප්‍රවර්ධනය කිරීම

V සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාපණ හැකියාව, ආරම්භක ශක්තිය, විචාරශීලී චින්තනය, වගකීම හා වගවීම ඇතුළු වෙනත් ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය කිරීම

VI පුද්ගලයාගේ සහ ජාතියේ ජීවගුණය වැඩි දියුණු කෙරෙන සහ ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා දායක වන ඵලදායි කාර්යයන් සඳහා අධ්‍යාපනය තුළින් මානව සම්පත් සංවර්ධනය කිරීම.

VII ශීඝ්‍රයෙන් වෙනස් වන ලෝකයක් තුළ සිදු වන වෙනස්කම් අනුව හැඩ ගැසීමට හා ඒවා පාලනය කර ගැනීමට පුද්ගලයන් සුදානම් කිරීම සහ සංකීර්ණ හා අනපේක්ෂිත අවස්ථාවන්ට සාර්ථක ව මුහුණ දීමේ හැකියාව වර්ධනය කිරීම

VIII ජාත්‍යන්තර ප්‍රජාව අතර ගෞරවනීය ස්ථානයක් හිමි කර ගැනීමට දායක වන යුක්තිය, සමානත්වය සහ අන්‍යෝන්‍ය ගරුත්වය මත පදනම් වූ ආකල්ප හා කුසලතා පෝෂණය කිරීම.

[illegible]: (ජාතික අධ්‍යාපන කොමිෂන් වාර්තාව 2003)

.

## මූලික නිපුණතා

අධ්‍යාපනය තුළින් වර්ධනය කෙරෙන පහත දැක්වෙන මූලික නිපුණතා ඉහත සඳහන් ජාතික අරමුණු ඉටුකර ගැනීමට දායක වනු ඇත

(i) සන්නිවේදන නිපුණතා

සාක්ෂරතාව, සංඛ්‍යා පිළිබඳ දැනුම, රූපක භාවිතය සහ තොරතුරු තාක්ෂණ ප්‍රවීණතාව යන අනුකාණ්ඩ 4ක් මත සන්නිවේදන නිපුණතා පදනම් වේ.

සාක්ෂරතාව : සාවධාන ව ඇහුම්කන් දීම, පැහැදිලි ව කථා කිරීම, තේරුම් ගැනීම සඳහා කියවීම, නිවැරදි ව සහ නිරවුල් ව ලිවීම, ඵලදායි අයුරින් අදහස් හුවමාරු කර ගැනීම

සංඛ්‍යා පිළිබඳ දැනුම : භාණ්ඩ, අවකාශය හා කාලය, ගණන් කිරීම, ගණනය සහ මිනුම් සඳහා ක්‍රමානුකූල ඉලක්කම් භාවිතය

රූපක භාවිතය : රේඛා සහ ආකෘති භාවිතයෙන් අදහස් පිළිබිඹු කිරීම සහ රේඛා, ආකෘති සහ වර්ණ ගළපමින් විස්තර, උපදෙස් හා අදහස් ප්‍රකාශනය හා වාර්තා කිරීම

තොරතුරු තාක්ෂණ ප්‍රවීණතාව : පරිගණක දැනුම සහ ඉගෙනීමේ දී ද සේවා පරිශ්‍රයන් තුළ දී ද පෞද්ගලි ජීවිතයේ දී ද තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය උපයෝගී කර ගැනීම

(ii) පෞරුෂත්ව වර්ධනයට අදාළ නිපුණතා

- නිර්මාණශීලී බව, අපසාරී චින්තනය, ආරම්භක ශක්තීන්, තීරණ ගැනීම, ගැටලු නිරාකරණය කිරීම, විචාරශීලී හා විග්‍රහාත්මක චින්තනය, කණ්ඩායම් හැඟීමෙන් කටයුතු කිරීම, පුද්ගලාන්තර සබඳතා, නව සොයා ගැනීම් සහ ගවේෂණය වැනි වර්ගීය කුසලතා

- ඍජු ගුණය, ඉවසා දරා සිටීමේ ශක්තිය සහ මානව අභිමානයට ගරු කිරීම, වැනි අගයයන්

- චිත්තවේගී බුද්ධිය

(iii) පරිසරයට අදාළ නිපුණතා

මෙම නිපුණතා සාමාජික, ජෛව සහ භෞතික පරිසරයට අදාළ වේ.

සමාජ පරිසරය : ජාතික උරුමයන් පිළිබඳ අවබෝධය, බහුවාර්ගික සමාජයක සාමාජිකයන් වීම හා සම්බන්ධ සංවේදීතාව හා කුසලතා, සාධාරණ යුක්තිය පිළිබඳ හැඟීම, සමාජ සම්බන්ධතා, පෞද්ගලික චර්යාව, සාමාන්‍ය හා නෛතික සම්ප්‍රදායයන්, අයිතිවාසිකම්, වගකීම්, යුතුකම් සහ බැඳීම්

ජෛව පරිසරය : සජීවී ලෝකයක, ජනතාව සහ ජෛව පද්ධතිය, ගස් වැල්, වනාන්තර, මුහුද, ජලය, වාතය සහ ජීවය - ශාක, සත්ත්ව හා මිනිස් ජීවිතයට සම්බන්ධ වූ අවබෝධය, සංවේදී බව හා කුසලතා

භෞතික පරිසරය : අවකාශය, ශක්තිය, ඉන්ධන, ද්‍රව්‍ය, භාණ්ඩ සහ මිනිස් ජීවිතයට ඒවායේ ඇති ම්බන්ධතාව, ආහාර, ඇඳුම්, නිවාස, සෞඛ්‍ය, සුව පහසුව, ශ්වසනය, නින්ද, නිස්කලංකය, විවේකය, අපද්‍රව්‍ය සහ මලපහ කිරීම යනාදිය හා සම්බන්ධ වූ අවබෝධය, සංවේදිතාව හා කුසලතාව. ඉගෙනීම, වැඩ කිරීම සහ ජීවත් වීම සඳහා මෙවලම් සහ තාක්ෂණය ප්‍රයෝජනයට ගැනීමේ කුසලතා මෙහි අඩංගු වේ.

(IV) වැඩ ලෝකයට සුදානම් වීමේ නිපුණතා

ආර්ථික සංවර්ධනයට දායක වීම,
තම වෘත්තීය ලැදියා සහ අභියෝග්‍යතා හඳුනා ගැනීම,
හැකියාවනට සරිලන අයුරින් රැකියාවක් තෝරා ගැනීම සහ
වාසිදායක හා තිරසාර ජීවනෝපායක නිරත වීම,
යන හැකියාවන් උපරිම කිරීමට හා ධාරිතාව වැඩි කිරීමට අදාළ සේවා නියුක්තිය හා සම්බන්ධ කුසලතා



(V) ආගම සහ සදාචාර ධර්මයන්ට අදාළ නිපුණතා

පුද්ගලයන්ට තම දෛනික ජීවිතයේ දී ආචාර ධර්ම, සදාචාරාත්මක හා ආගමානුකූල හැසිරීම් රටාවන්ට අනුගත වෙමින් වඩාත් උචිත දේ තෝරා එයට සරිලන සේ කටයුතු කිරීම සඳහා අගයයන් උකහා ගැනීම හා ස්වීයකරණය

(VI) ක්‍රීඩාව සහ විවේකය ප්‍රයෝජනයට ගැනීමේ නිපුණතා

සෞන්දර්යය, සාහිත්‍යය, සෙල්ලම් කිරීම, ක්‍රීඩා හා මලල ක්‍රීඩා, විනෝදාංශ හා වෙනත් නිර්මාණාත්මක ජීවන රටාවන් තුළින් ප්‍රකාශ වන විනෝදය, සතුට, ආවේග සහ එවන් මානුෂික අත්දැකීම්

(VII) "ඉගෙනීමට ඉගෙනුම" පිළිබඳ නිපුණතා

ශීඝ්‍රයෙන් වෙනස් වන සංකීර්ණ හා එකිනෙකා මත යැපෙන ලෝකයක පරිවර්තන ක්‍රියාවලියක් හරහා වෙනස්වීම් හසුරුවා ගැනීමේ දී හා ඊට සංවේදී ව හා සාර්ථක ව ප්‍රතිචාර දැක්වීමත් ස්වාධීන ව ඉගෙන ගැනීමත් සඳහා පුද්ගලයන්ට ශක්තිය ලබා දීම.

(ජාතික අධ්‍යාපන කොමිෂන් වාර්තාව 2003)

## 02. හින්දී භාෂාව විෂය අධ්‍යයනයේ අරමුණු

- හින්දී භාෂාව නිවැරදි ව කියවීමේ සහ ලිවීමේ කෞශල්‍යය වර්ධනය කර ගැනීම.
- හින්දී භාෂාවේ මූලික ව්‍යාකරණය සහ සරල භාෂා ප්‍රයෝග අවබෝධ කර ගැනීම.
- හින්දී ගද්‍ය, පද්‍ය කොටස් මාතෘ භාෂාවටත්, මාතෘ භාෂාවෙන් හින්දී භාෂාවටත් පරිවර්තනය කිරීමේ හැකියාව ලබා ගැනීම.
- භාරතීයයන් සමග සන්නිවේදනය කිරීමේ ශක්‍යතාව වර්ධනය කර ගැනීම.
- භාරතීය සංස්කෘතියෙහි මූලධර්ම උකහාගෙන මානව හිතවාදී සමාජයක් ගොඩනැගීම සඳහා මංපෙත් විවර කර ගැනීම.
- සෞන්දර්ය විෂයයන්, ඉතිහාසය, පුරාවිද්‍යාව සහ ආයුර්වේදය සම්බන්ධ දැනුම පුළුල් කර ගැනීම

සඳහා මංපෙත් විවර කර ගැනීම.

- සාහිත්‍ය රසාස්වාදයට රුකුලක් වීම.

## හින්දි විෂය නිර්දේශය - 11 ශ්‍රේණිය
## පාසල් වාර වශයෙන් බෙදා ගැනීමට යෝජිත සැලසුම

| ශ්‍රේණිය | වාරය | නිපුණතා මට්ටම | කාලච්ඡේද සංඛ්‍යාව |
|---|---|---|---|
| 11 | I | 1.1, 1.2<br>2.1, 2.2<br>3.1, 3.2<br>4.1<br>5.1<br>6.1 | 30 |
| | 11 | 4.2<br>5.1,5.2<br>6.1,6.2<br>7.1 | 30 |
| | III | 4.3<br>5.3<br>6.3<br>7.1,7.2<br>8.1,8.2 | 30 |

## හින්දි විෂය නිර්දේශය -2016

**11 ශ්‍රේණිය**

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 1.0 හින්දී භාෂාව නිවැරදි ව උච්චාරණය කිරීමේ හැකියාව ලබයි. | 1.1 හින්දී වාක්‍ය නිවැරදි ව උච්චාරණය කරයි. | • අක්ෂරවල උච්චාරණ විශේෂතා සහ විරාම ලක්ෂණ පිළිබඳ ව සැලකිලිමත් වෙමින් සරල සහ සංයුක්ත වාක්‍ය නිවැරදි ව උච්චාරණය කිරීම.<br>(විරාමය, ප්‍රශ්නාර්ථය, අර්ධ විරාමය, හර්ෂාදී ලකුණ) | • අල්පප්‍රාණ මහාප්‍රාණ භේදය හඳුනාගෙන උච්චාරණය කරයි.<br>• අනුස්වාරය හා අර්ධඅනුස්වාරය නිවැරදි ව උච්චාරණය කරයි.<br>• උත්ක්ෂිප්ත ව්‍යඤ්ජන ( ड़, ढ़ ) නිවැරදි ව උච්චාරණය කරයි.<br>• ऐ, औ, ऋ ස්වර සහ ज़ , फ़ ව්‍යඤ්ජන නිවැරදි ව උච්චාරණය කරයි.<br>• විරාමාදී ලකුණු පිළිබඳ සැලකිලිමත් වෙමින් උච්චාරණය කරයි. | 02 |
| | 1.2 සරල ගද්‍ය - පද්‍ය කියවයි. | • සරල ගද්‍ය සහ පද්‍ය පාඨ, අක්ෂරවල උච්චාරණ විශේෂතා සහ විරාම ලක්ෂණ පිළිබඳ ව සැලකිලිමත් වෙමින් හඬ පාලනයකින් යුතු ව ශබ්ද නගා කියවීම. | | 02 |
| 2.0 හින්දී භාෂාව නිවැරදි ව ලිවීමේ හැකියාව ලබයි. | 2.1 හින්දී වචන නිවැරදි ව ලියයි. | | • අල්පප්‍රාණ මහප්‍රාණ පිළිබඳ අවබෝධයෙන් වචන ලියයි.<br>• ස්වර පිල්ලම් නිවැරදි ව යොදා ලියයි.<br>• සම්මත ව්‍යඤ්ජන සංයුක්ත නිවැරදි ව ලියයි. | 02 |
| | 2.2 සරල හින්දී වාක්‍ය නිවැරදි ව ලියයි. | • පද බෙදීම හා විරාම ලක්ෂණ ගැන සැලකිලිමත් වෙමින් වාක්‍ය ලිවීම් (අර්ධ විරාමය, නැවතීමේ ලකුණ□ ප්‍රශ්නාර්ථය, හර්ෂාදි ලකුණ) | • අල්පප්‍රාණ මහප්‍රාණ පිළිබඳ අවබෝධයෙන් වචන ලියයි.<br>• ස්වර පිල්ලම් නිවැරදි ව යොදා ලියයි.<br>• ශිරෝ රේඛාව නිවැරදි ව යොදයි.<br>• සම්මත ව්‍යඤ්ජන සංයුක්ත නිවැරදි ව ලියයි.<br>• පද බෙදීම හා විරාම ආදී ලකුණු ගැන සැලකිලිමත් වෙමින් වාක්‍ය ලියයි | 02 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 3.0 සවන් දී අර්ථය අවබෝධ කරගෙන ප්‍රතිචාර දක්වයි. | 3.1 සවන් දී හින්දී වචන හඳුනා ගනියි. | • හින්දී වචනවලට සවන් දී අර්ථය අවබෝධ කරගෙන ප්‍රතිචාර දැක්වීම. | • හින්දී වචනවලට සවන් දී අදාළ රූපය තෝරයි. | 02 |
| | 3.2 සරල විධානයන්ට සවන් දී අර්ථය අවබෝධ කර ගනියි. | • සරල විධානයන්ට සවන් දී අර්ථය අවබෝධ කරගෙන ප්‍රතිචාර දැක්වීම. | • සරල විධානවලට සවන් දී ප්‍රතිචාර දක්වයි.<br>• සරල ගද්‍ය කොටසකට සවන් දී ප්‍රතිචාර දක්වයි.<br>• සරල ගද්‍ය කොටසකට සවන් දී ස්මරණයෙන් පිළිතුරු දෙයි. | 03 |
| 4.0 භාෂණයෙහි යෙදෙයි. | 4.1 එකිනෙකා හඳුනා ගනියි. (තමා හා අන් අය) | • තමාව හඳුන්වා දීම.<br>• අන්අය හඳුන්වා දීම. | • තමා, පවුලේ සාමාජිකයින්, සහ රුචි අරුචිකම් පිළිබඳ ව විස්තර කරයි. | 02 |
| | 4.2 පෞද්ගලික තොරතුරු විමසයි. ප්‍රතිචාර දක්වයි. | • නම, ගම, වයස, වෘත්තීය ආදී වශයෙන් තොරතුරු විමසීම.<br>• විමසනු ලබන ප්‍රශ්නවලට පිළිතුරු දීම. | • අන් අය හඳුන්වා දෙයි.<br>• ප්‍රශ්න වාචක පද භාවිත කරයි. | 03 |
| | 4.3 සිද්ධියක් විස්තර කරයි | • සරල වචන භාවිතයෙන් යම් සිද්ධියක් විස්තර කිරීම. | • සිද්ධියක් සරල ව විස්තර කරයි. | 03 |
| 5.0 මූලික ව්‍යාකරණ රටා හඳුනාගෙන භාවිත කරයි. | 5.1 ක්‍රියා පද භාවිත කරයි. | • විධි ක්‍රියා, පූර්ව ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, चाहिए, सकना ආදි ක්‍රියා ප්‍රභේද අවබෝධ කර ගැනීම. | • විධි ක්‍රියා රූප නිර්මාණය කරයි.<br>• ප්‍රත්‍ය භාවිතයෙන් පූර්ව ක්‍රියා නිර්මාණය කරයි.<br>• මිශ්‍ර ක්‍රියා නිර්මාණය කරයි.<br>• "යුතුයි"යන අදහස ප්‍රකාශ කිරීමට ක්‍රියා නාමය සමඟ चाहिए යොදයි.<br>• ශක්‍යතාව ප්‍රකාශ කිරිම සඳහා सकना යොදයි. | 25 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 5.2 අතීත කාලය නිවැරදිව භාවිත කරයි. | • सरल भूत කාලය<br>• තාත්කාලික් භූත් කාලය<br>• සාමාන්‍ය භූත් කාලය | • සරල අතීත කාල වාක්‍ය නිර්මාණය කරයි.<br>• පවතින අතීත කාල වාක්‍ය කිර්මාණය කරයි.<br>• අතීත කාල ක්‍රියා අකර්මක, සකර්මක වශයෙන් වර්ග කරයි.<br>• ने ප්‍රත්‍යය නිවැරදි ව යොදයි.<br>• අතීත කාල ක්‍රියාව නිවැරදි ව භාවිත කරයි. | 10 |
| | 5.3 අව්‍ය පද භාවිත කරයි. | • के साथ, के पास, के अंदर, के बाहर, के सामने, के आगे, के पीछे, के नीचे, के ऊपर, के कारण, के लिए, की ओर, की तरह වැනි සම්බන්ධ සූචක අව්‍ය පද හඳුන්වා දීම.<br>• और, भी, ही, लेकिन, इसलिए වැනි අව්‍ය පද හඳුන්වා දීම. | • නාම පද සහ සර්වනාම පද සමඟ අව්‍ය පද යොදයි.<br>• ක්‍රියා පද සමඟ අව්‍ය පද භාවිත කරයි.<br>• අව්‍ය පද භාවිත කරමින් වාක්‍ය සම්බන්ධ කරයි. | 04 |
| 6.0 හින්දියෙන් ගණන් කරයි. | 6..1 ක්‍රමාංක සංඛ්‍යා ගණන් කරයි. | • 1-10 දක්වා ක්‍රමාංක සංඛ්‍යා ගණන් කරයි. | • 1-10 දක්වා ක්‍රමාංක සංඛ්‍යා ප්‍රකාශ කරයි.<br>• 1-10 දක්වා ක්‍රමාංක සංඛ්‍යා විශේෂණ ලෙස භාවිත කරයි.<br>• 1-10 දක්වා ක්‍රමාංක සංඛ්‍යා යොදා වාක්‍ය ගොඩ නගයි. | 02 |
| | 6.2 හින්දියෙන් වෙලාව ප්‍රකාශ කරයි. | • පූර්ණ, හමාර, කාල වශයෙන් වෙලාව දැක්වීම. | • පූර්ණ සංඛ්‍යා භාවිත කරමින් වෙලාව කියයි.<br>• අපූර්ණ සංඛ්‍යා භාවිත කරමින් වෙලාව කියයි.<br>• වෙලාව විමසීමේ දී වාක්‍ය රටා හඳුනාගෙන භාවිත කරයි. | 02 |
| | 6.3 හින්දියෙන් මිනුම් දක්වයි. | • බර, දිග, මුදල් සඳහා අංක භාවිත කිරීම. | | 02 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 7.1 කියවා ප්‍රතිචාර දක්වයි | 7.1 කියවා අර්ථය අවබෝධ කරගනියි. | • ගද්‍ය/පද්‍ය පාඨ කියවා අවබෝධ කරගනියි. | • ගද්‍ය/පද්‍ය පාඨ කියවා දුරවබෝධ පදවල අර්ථය විමසා දැන ගනියි.<br>• ගද්‍ය/පද්‍ය පාඨ කියවා අසන ලද ප්‍රශ්නවලට පිළිතුරු සපයයි.<br>• සමානාර්ථ පද ලියයි.<br>• විරුද්ධාර්ථ පද ලියයි. | 04 |
| | 7.2 චිත්‍ර සටහන් විස්තර කරයි. | • පිංතූරයක් දෙස බලා අදහස් ප්‍රකාශ කිරීම. | • දී ඇති චිත්‍රය දෙස බලා අසන ලද ප්‍රශ්නවලට වාචික ව පිළිතුරු දෙයි.<br>• චිත්‍රය දෙස බලා පිළිතුරු ලකුණු කරයි.<br>• චිත්‍රය දෙස බලා අදහස් ප්‍රකාශ කරයි.<br>• අදහස් ප්‍රකාශ කිරීමේදී ව්‍යාකරණ නිවැරදි ව භාවිත කරයි. | 06 |
| 8.0 පරිවර්තනය කරයි | 8.1 හින්දී වාක්‍ය සිංහල/ දෙමළ/ ඉංග්‍රීසි භාෂාවට පරිවර්තනය කරයි | • හින්දී ගද්‍ය/පද්‍ය පාඨ සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාවට පරිවර්තනය කිරීම. | • දී ඇති හින්දී ඡේදය සිංහල/දෙමළ/ඉංග්‍රිසි භාෂාවට පරිවර්තනය කරයි.<br>• දී ඇති සිංහල/දෙමළ/ඉංග්‍රිසි ඡේදය හින්දියට පරිවර්තනය කරයි. | 07 |
| | 8.2 සිංහල/දෙමළ/ ඉංග්‍රීසි වාක්‍ය හින්දී භාෂාවට පරිවර්තනය කරයි. | • සිංහල/දෙමළ/ ඉංග්‍රීසි වාක්‍ය හින්දී භාෂාවට පරිවර්තනය කරයි. | • ලක්ෂ්‍ය භාෂාවේ වාක්‍ය රීතීන්ට අනුගතව වාක්‍ය පරිවර්තනය කරයි.<br>• දී ඇති ඡේදයේ කාල භේදය සැලකිල්ලට ගෙන පරිවර්තනය කරයි. | 07 |

## 03. පරිශීලන ග්‍රන්ථ

- **'මානක් ව්‍යාවහාරික් හින්දී ව්‍යාකරණ් තථා රචනා'** (1995) ශ්‍යාම් ජී ගෝකුල් වර්මා, ආයී බුක් බිෆෝ, කරෝල්බාද්,නර් දිල්ලී
- **'ආධුනික් හින්දී ව්‍යාකරණ් ඖර් රචනා'** (1996) වාසුදේව නන්දන් ප්‍රසාද්, භාරතී භවන්, පට්නා
- **'හින්දී වියරණ හුරුව'** (2005,2008) ලක්ෂ්මන් සෙනෙවිරත්න, සමයවර්ධන ග්‍රන්ථ ප්‍රකාශකයෝ, කොළඹ 10.
- **'හින්දී ලේඛන හුරුව'** (2008) ලක්ෂ්මන් සෙනෙවිරත්න, කර්තෘ ප්‍රකාශනයකි.
- **'සිංහල හින්දී ප්‍රායෝගික ශබ්ද සංග්‍රහය'** (2004) ලක්ෂ්මන් සෙනෙවිරත්න, එස්. ගොඩගේ සහ සහෝදරයෝ, මරදාන පාර, කොළඹ 10.
- **'හින්දී කථන හුරුව'** (2010) ඉන්ද්‍රා දසනායක, ලක්ෂ්මන් සෙනෙවිරත්න, සමයවර්ධන ග්‍රන්ථ ප්‍රකාශකයෝ, කොළඹ 10.

## 04. ඉගෙනුම් සහ ඉගැන්වීම් ක්‍රමෝපාය

4.1 ලේඛනය සහ උච්චාරණය හුරු කිරීම සඳහා

4.1.1 කණ්ඩායම් වශයෙන් වෙන් කොට උච්චාරණයට අදාළ ශබ්ද හඳුනා ගැනීමට සැලැස්වීම.

4.1.2 කියවන විට ලිවීම

4.1.3 ශ්‍රව්‍ය-දෘශ්‍ය මාධ්‍යයන් ඇසුරෙන් උච්චාරණ විශේෂතා අධ්‍යයනය කිරීමට සැලැස්වීම.

4.1.4 කණ්ඩායම් වශයෙන් හෝ තනි තනිව ම හෝ වචනයට අදාළ රූපයත්, රූපයට අදාළ වචනයත් හඳුනා ගැනීමට සැලැස්වීම.

4.2 ව්‍යාකරණය

4.2.1 සෑම ව්‍යාකරණ පාඩමකට ම අදාළ ව විවිධ අභ්‍යාස කරවීම.

4.2.2 කණ්ඩායම් වශයෙන් හෝ තනි තනිව ම හෝ ඉගෙනගත් ව්‍යාකරණ පාඩම් සිසුන් ලවා පැහැදිලි කිරීමට සැලැස්වීම.

4.3 සංවාද පුහුණුව

4.3.1 සිසුන්ගෙන් උත්තර බලාපොරොත්තුවෙන් ප්‍රශ්න ඇසීම.

4.3.2 උත්තරයට අදාළ ප්‍රශ්නය සිසුන් ලවා විමසවීම.

4.3.3 ක්ෂණික මාතෘකා යටතේ කෙටි වාක්‍ය නිර්මාණය කිරීම.

4.3.4 පින්තූර පෙන්වා විස්තර ඇසීම.

4.3.5 යුගල වශයෙන් හෝ කණ්ඩායම් වශයෙන් සංවාද පුහුණු කිරීම.

4.4 පන්තිය තුළ ම හින්දී පොතපත කියවීම පුහුණු කිරීම සඳහා පුස්තකාලයක් පවත්වාගෙන යෑම.

## 5.0 පාසල් ප්‍රතිපත්ති හා වැඩසටහන්

හින්දී භාෂාව හැදෑරීමෙන් පසු එම දැනුම, කුසලතා හා නව ආකල්ප භාවිතයට ගනිමින් පාසලේ විෂය සමගාමී කටයුතු ලෙස පහත සඳහන් කාර්යයන් ක්‍රියාත්මක කළ හැකි වනු ඇත. එනම්,

5.1 **'විශ්ව හින්දී දිනය/හින්දී භාෂා දිනය'** සැමරීම.

5.2 ස්ව නිර්මාණ ද ඇතුළත් **'හින්දී සගරාවක්'** නිර්මාණය කිරීම.

5.3 පාසලේ පැවැත්වෙන රැස්වීම්වල දී හින්දී බසින් ප්‍රවෘත්ති, කථා සහ ගීත ආදිය ඉදිරිපත් කිරීම.

5.4 උත්තර භාරතීය සංස්කෘතිය විදහා දැක්වෙන වැඩමුළු, ප්‍රදර්ශන ආදිය පැවැත්වීම.

5.5 පාසල තුළ හෝ අන්තර් පාඨශාලීය මට්ටමින් හෝ හින්දී බසින් රචනා, කථික, ගීත නිර්මාණ, නාට්‍ය ආදි තරග පැවැත්වීම.

5.6 හින්දී භාෂාව පිළිබඳ ව වැඩිදුර දැනුමක් ලබා දීම සඳහා තද්විෂය හා සම්බන්ධ වියතුන්ගේ සහභාගිත්වයෙන් සම්මන්ත්‍රණ පැවැත්වීම.

## 6.0 තක්සේරුව හා ඇගයීම

පාසල පදනම් කරගත් ඇගයීම් වැඩපිළිවෙළ යටතේ එක් එක් වාරය සඳහා නියමිත නිපුණතා හා නිපුණතා මට්ටම් ආවරණය වන පරිදි ඉගෙනුම් ඉගැන්වීම් උපකරණ නිර්මාණාත්මක ව පිළියෙළ කොට ක්‍රියාත්මක කිරීම අපේක්ෂිතයි. ඉගෙනුම් කාර්යයේ දී අපේක්ෂිත නිපුණතා මට්ටමට පැමිණ අත්පත් කරගෙන ඇති ඉගෙනුම් පලයන්ගේ ගුණාත්මක බව සොයාබැලීමට තක්සේරුව හා ඇගයීම අවශ්‍ය වේ.

නිපුණතා මට්ටම් ඔස්සේ අපේක්ෂිත ඉගෙනුම් පලවලට ළඟා වන ආකාරය හඳුනා ගැනීම තක්සේරුවේ දී සිදු වේ. මුල දී තීරණය කරගත් නිර්ණායක සමග සසඳා බලමින් අදාළ නිපුණතා කවර මට්ටමකින් සිසුවා සාක්ෂාත් කරගෙන තිබේදැයි පරීක්ෂා කළ යුතු වේ. ඒ අනුව ප්‍රබලතා-දුබලතා හඳුනාගෙන ප්‍රතිපෝෂණ හා ඉදිරි පෝෂණ වැඩ සටහන් සංවිධානය කළ යුතු ය. ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය අතරතුර දී කණ්ඩායම් ගවේෂණය, ශිෂ්‍ය ක්‍රියාකාරකම් ඉදිරිපත් කිරීම යන අවස්ථාවල තක්සේරු කාර්යය මැනවින් කළ හැකිය.

තක්සේරු කාර්යයට අමතර ව ඇගයීම් වැඩ පිළිවෙළ යනු ශිෂ්‍යයාගේ ප්‍රවීණතා මට්ටම තීරණය කිරීම ය. ප්‍රවීණතා මට්ටම විනිශ්චයේ දී සිසුන් හිමි කරගත් ශ්‍රේණි හා ලකුණු සසඳා ඔවුන්ගේ ප්‍රගතිය සොයා බැලිය යුතු ය.

# ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස්

**නිපුණතාව 1**

හින්දී භාෂාව නිවැරදි ව උච්චාරණය කිරීමේ හැකියාව ලබයි.

**නිපුණතා මට්ටම**

1.1 හින්දී වාක්‍ය නිවැරදි ව උච්චාරණය කරයි.

1.2 සරල ගද්‍ය පද්‍ය කියවයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** 04

**ඉගෙනුම් පල**

- අල්පප්‍රාණ මහප්‍රාණ භේදය හඳුනාගෙන උච්චාරණය කරයි.
- අනුස්වාරය හා අර්ධඅනුස්වාරය නිවැරදි ව උච්චාරණය කරයි.
- උත්ක්ෂිප්ත ව්‍යඤ්ජන ( ड़, ढ़ ) නිවැරදි ව උච්චාරණය කරයි.
- ऐ, औ, ऋ ස්වර සහ ज़, फ ව්‍යඤ්ජන නිවැරදි ව උච්චාරණය කරයි.
- විරාමාදී ලකුණු පිළිබඳ සැලකිලිමත් වෙමින් උච්චාරණය කරයි.

**විෂය කරුණුවල සංක්ෂිප්තය**

- අල්පප්‍රාණ මහප්‍රාණ භේදය අනුව වචනවල අර්ථය වෙනස්වන බව
- අර්ධ අනුස්වාරය වෙනුවට අනුස්වාරය උච්චාරණය නොකළ යුතු බව
- ड़, ढ़ ව්‍යඤ්ජනවල උච්චාරණය ड, ढ ව්‍යඤ්ජන උච්චාරණයට වෙනස්වන බව
- ऐ, औ, ऋ ස්වරවල උච්චාරණය සිංහල භාෂාවේ ඓ, ඖ, ඍ ස්වරවලට වඩා වෙනස් බව
- විරාමය, ප්‍රශ්නාර්ථය, අර්ධ විරාමය, හර්ෂාදී ලකුණු පිළිබඳ ව සැලකිලිමත් විය යුතු බව

**යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය**

- ඉහත නිපුණතා මට්ටම්වලට ළඟාවිය හැකි කියවීමේ ආදර්ශනයක් ලබා දෙන්න.
- ශබ්ද නඟා කියවීමට සලස්වන්න.
- වැරදි උච්චාරණය නිවැරදි කර සමරූපණය කරවන්න.

**ගුණාත්මක යෙදවුම්**

- කියවීමේ ආදර්ශන
- පරිශීලන ග්‍රන්ථ

**තක්සේරුව හා ඇගයීම සඳහා නිර්ණායක**

- මහප්‍රාණ ව්‍යඤ්ජන නිවැරදි ව උච්චාරණය කරයි.
- අර්ධ අනුස්වාරය නිවැරදි ව උච්චාරණය කරයි.
- ड़, ढ़ නිවැරදි ව උච්චාරණය කරයි.
- ऐ, औ, ऋ, ज़, फ නිවැරදි ව උච්චාරණය කරයි.
- ह ට පෙර යෙදෙන ස්වර විපර්යාස හඳුනාගෙන නිවැරදි ව උච්චාරණය කරයි.

**නිපුණතාව 2**

හින්දි භාෂාව නිවැරදි ව ලිවීමේ හැකියාව ලබයි.

**නිපුණතා මට්ටම**

2.1 හින්දි වචන නිවැරදි ව ලියයි.

2.2 සරල හින්දි වාක්‍ය නිවැරදි ව ලියයි.

**කාලච්ඡේද සංඛ්‍යාව 04 යි.**

**ඉගෙනුම් පල**

- අල්පප්‍රාණ මහප්‍රාණ පිළිබඳ අවබෝධයෙන් වචන ලියයි.
- ස්වර පිල්ලම් නිවැරදි ව යොදා ලියයි.
- යටි තිත නිවැරදි ව යොදා වචන ලියයි.
- ශිරෝ රේඛාව නිවැරදි ව යොදයි.
- සම්මත ව්‍යඤ්ජන සංයුක්ත නිවැරදි ව ලියයි.
- පද බෙදීම හා විරාම ආදී ලකුණු ගැන සැලකිලිමත් වෙමින් වාක්‍ය ලියයි.

**විෂය කරුණුවල සංක්ෂිප්තය**

- අල්පප්‍රාණ මහප්‍රාණ භේදය අනුව වචනවල අර්ථය වෙනස්වන බව
- සම්මත ක්‍රමයට ස්වර පිල්ලම් යෙදිය යුතු බව
- ලේඛනයේ දී යටි තිත හා ශිරෝ රේඛාව ගැන සැලකිලිමත් විය යුතු බව
- අර්ථාවබෝධය සඳහා පද බෙදීම හා විරාම ආදී ලකුණු නිවැරදි ව යෙදිය යුතු බව

**යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය**

- උචිත ප්‍රවේශයකින් ආරම්භ කරන්න.
- වචන හා සරල වාක්‍ය අසා ලිවීමට සලස්වන්න.
- වැරදි නිවැරදි කරන්න.
- සම්මත ලේඛන නීති රීති සිහිපත් කරන්න.
- පිටපත් කිරීමේ අභ්‍යාස දෙන්න.

**ගුණාත්මක යෙදවුම්**

- අක්ෂර මාලාව සහිත පුවරු
- පරිශීලන ග්‍රන්ථ

**තක්සේරුව හා ඇගයීම සඳහා නිර්ණායක**

- මහප්‍රාණ ව්‍යඤ්ජන නිවැරදි ව භාවිත කරයි.
- ස්වර පිල්ලම් නිවැරදි ව යොදයි.
- යටි තිත හා ශිරෝ රේඛාව නිවැරදි ව යොදයි.
- නිවැරදි ව පද බෙදා ලියයි.
- විරාමාදී ලකුණු නිවැරදි ව යොදයි.

**නිපුණතාව 3**

සවන් දී අර්ථය අවබෝධ කරගෙන ප්‍රතිචාර දක්වයි.

**නිපුණතා මට්ටම**

3.1 සවන් දී හින්දී වචන හඳුනා ගනියි.

3.2 සරල විධානයන්ට සවන් දී අර්ථය අවබෝධ කර ගනියි

**කාලච්ඡේද සංඛ්‍යාව 05**

**ඉගෙනුම් පල**

- හින්දී වචනවලට සවන් දී අදාළ රූපය තෝරයි.
- සරල විධානවලට සවන් දී ප්‍රතිචාර දක්වයි.
- සරල ගද්‍ය කොටසකට සවන් දී ප්‍රතිචාර දක්වයි.
- සරල ගද්‍ය කොටසකට සවන් දී ස්මරණයෙන් පිළිතුරු දෙයි.

**විෂය කරුණුවල සංක්ෂිප්තය**

- පන්ති කාමරයේ දී හා නිවසේ දී භාවිත කරන උපකරණවලට අදාළ වචන හඳුනාගත යුතු බව
- එදිනෙදා බහුල ව ව්‍යවහාර කරන ක්‍රියාපද සවන් දී හඳුනාගත යුතු බව

**යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය**

- හඬ පටයකට සවන් දීමට සලස්වන්න. (සරල කතාන්දරයක් සහ විධාන ඇතුළත් හඬ පටයක්)
- කතාන්දරයට අදාළ ප්‍රශ්නාවලියක් ලබා දෙන්න.
- සවන් දෙන අතරතුර පිළිතුරු ලකුණු කිරීමට උපදෙස් දෙන්න.

**ගුණාත්මක යෙදවුම්**

- හඬ පටයක්
- සරල ගද්‍ය ඡේදයක්
- රූප රාමු
- විධාන සහිත සංවාදයක්

**තක්සේරුව හා ඇගයීම සඳහා නිර්ණායක**

- සවන් දී අදාළ රූපය තෝරයි.
- සවන් දී නිවැරදි පිළිතුර ලකුණු කරයි.

**නිපුණතාව 4**

භාෂණයෙහි යෙදයි

**නිපුණතා මට්ටම**

4.1 එකිනෙකා හඳුනා ගනියි. (තමා හා අන් අය)

4.2 පෞද්ගලික තොරතුරු විමසයි, ප්‍රතිචාර දක්වයි.

4.3 සිද්ධියක් විස්තර කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව 08**

**ඉගෙනුම් පල**

- තමා, පවුලේ සාමාජිකයින්, සහ රුචි අරුචිකම් පිළිබඳ ව විස්තර කරයි.
- අන් අය හඳුන්වා දෙයි.
- ප්‍රශ්න වාචක පද භාවිත කරයි.
- සිද්ධියක් සරල ව විස්තර කරයි.

**යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය**

- ආදර්ශනයක් සිසුන්ට ලබා දෙන්න.
- හඬපටය ශ්‍රවණයට අවස්ථාව ලබා දෙන්න.
- යුගල වශයෙන් සිසුන් පුහුණු කරවන්න.
- සංවාදයක් /සිද්ධියක් නිර්මාණයට උපදෙස් දෙන්න.
- අදාළ වාග්කෝෂ ඥානය ලබා දෙන්න.

**අදාළ විෂය කරුණුවල සංක්ෂිප්තය**

- තමා පිළිබඳ ව විස්තර කිරීමේ දී තමා සහ පවුලේ සාමාජිකයන්ගේ වෘත්තීය සහ රුචි අරුචිකම් ආදිය ප්‍රකාශ කළ යුතු බව
- අන් අය හඳුන්වාදීමේ දී, තමාට ඇති සම්බන්ධය, ඔවුන්ගේ නම් ගම් ආදි තොරතුරු ප්‍රකාශ කළ යුතු බව
- ප්‍රශ්න ඇසීමේ දී क्या, कौन, कहाँ, कब, क्या., कितना, कैसा වැනි ප්‍රශ්න වාචක පද භාවිත කළ යුතු බව
- සිද්ධියක් විස්තර කිරීමේ දී නිවසේ දී, පාසලේ දී, මාර්ගයේ දී විය හැකි සිදුවීම්වලට සීමා විය යුතු බව

**ගුණාත්මක යෙදවුම්**

- හඬ පටයක්

**තක්සේරුව හා ඇගයීම සඳහා නිර්ණායක**

- තමා පිළිබඳ තොරතුරු කියයි.
- පවුලේ සාමාජිකයින් පිළිබඳ තොරතුරු කියයි.
- අන් අය හඳුන්වා දෙයි.
- සිද්ධියක් සරල ව වාර්තා කරයි.

**නිපුණතාව 5**

මූලික ව්‍යාකරණ රටා හඳුනාගෙන භාවිත කරයි.

**නිපුණතා මට්ටම**

5.1 ක්‍රියාපද භාවිත කරයි. (විධික්‍රියා)

**කාලච්ඡේද සංඛ්‍යාව 05**

**ඉගෙනුම් පල**

- හින්දියෙන් ආමන්ත්‍රණය සඳහා යෙදෙන සර්වනාම හඳුනාගෙන කියයි.
- විධි ක්‍රියා රූප නිර්මාණය කරයි.
- ආමන්ත්‍රණය අනුව සුදුසු විධික්‍රියාව භාවිත කරයි.
- විධි ක්‍රියාවේ නිෂේධාර්ථය හඳුනාගෙන භාවිත කරයි.
- එදිනෙදා ව්‍යවහාරයේ දී විධි ක්‍රියාව යොදයි.

**විෂය කරුණුවල සංක්ෂිප්තය**

- ආමන්ත්‍රණයේ දී आप, आप लोग, तुम, तुम लोग, तू යන සර්වනාම භාවිත වන බව
- සර්වනාමයට අනුව උචිත විධි ක්‍රියා රූපය භාවිත කළ යුතු බව
- නිශේධාර්ථයේ දී मत, न නිපාත ගැළපෙන පරිදි යෙදිය යුතු බව
- විධි ක්‍රියා රූප නිර්මාණයේ දී ක්‍රියා මූලය සමග इए සහ ओ ප්‍රත්‍ය එක් කළ යුතු බව

**යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය**

- උචිත ප්‍රවේශයකින් ආරම්භ කරන්න.
- ආමන්ත්‍රණයේ දී යෙදෙන සර්වනාම හඳුන්වා දෙන්න.
- වගුවක ආධාරයෙන් විධානාඛ්‍යාත රූප නිර්මාණය පැහැදිලි කරන්න.
- නිෂේධාර්ථයේ දී मत, न යෙදෙන ආකාරය විස්තර කරන්න.
- වාක්‍ය නිර්මාණය කර භාෂණයෙහි යොදවන්න.

**ගුණාත්මක යෙදවුම්**

- සංවාද සහිත හඬපටයක්
- දෘශ්‍යාධාරක

**තක්සේරුව හා ඇගයීම සඳහා නිර්ණායක**

- උචිත ප්‍රත්‍ය භාවිතයෙන් විධි ක්‍රියා රූප නිර්මාණය කරයි.
- සර්වනාමයට උචිත විධි ක්‍රියා රූපය යොදයි
- मत, न උචිත ස්ථානයෙහි යොදයි.
- විධානාඛ්‍යාතය යොදමින් භාෂණයෙහි යෙදෙයි.

**නිපුණතාව 5**

මූලික ව්‍යාකරණ රටා හඳුනාගෙන භාවිත කරයි.

**නිපුණතා මට්ටම**

5.1 ක්‍රියා පද භාවිත කරයි (පූර්ව ක්‍රියා)

**කාලච්ඡේද සංඛ්‍යාව 05**

**ඉගෙනුම් පල**

- පූර්ව ක්‍රියා ප්‍රත්‍ය හඳුනාගෙන කියයි.
- ප්‍රත්‍ය භාවිතයෙන් පූර්ව ක්‍රියා නිර්මාණය කරයි.
- පූර්ව ක්‍රියා යොදමින් වාක්‍ය ලියයි, කියයි.

**විෂය කරුණුවල සංක්ෂිප්තය**

- පූර්ව ක්‍රියා නිර්මාණයේ දී ක්‍රියාමූලයට कर හෝ के යෙදිය යුතු බව
- करना ක්‍රියාව සමඟ कर ප්‍රත්‍යය නොයෙදෙන බව
- අවසාන ක්‍රියාවට පෙර පූර්ව ක්‍රියාව යෙදිය යුතු බව

**යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය**

- උචිත ප්‍රවේශයකින් ආරම්භ කරන්න.
- පූර්ව ක්‍රියා ප්‍රත්‍ය හඳුන්වා දෙන්න.
- ප්‍රත්‍ය යොදා පූර්ව ක්‍රියා නිර්මාණය කරවන්න.
- පූර්ව ක්‍රියාව භාවිත කරවන්න.

**ගුණාත්මක යෙදවුම්**

- වගු සටහන්
- පරිශීලන ග්‍රන්ථ

**තක්සේරුව හා ඇගයීම සඳහා නිර්ණායක**

- පූර්ව ක්‍රියා ප්‍රත්‍ය නම් කරයි.
- ප්‍රත්‍ය යොදා පූර්ව ක්‍රියා නිර්මාණය කරයි.
- පූර්ව ක්‍රියා යොදමින් වාක්‍ය නිර්මාණය කරයි.

**නිපුණතාව 5**

මූලික ව්‍යාකරණ රටා හඳුනාගෙන භාවිත කරයි.

**නිපුණතා මට්ටම**

5.1 ක්‍රියා පද භාවිත කරයි (මිශ්‍ර ක්‍රියා)

**කාලච්ඡේද සංඛ්‍යාව 05**

**ඉගෙනුම් පල**

- මිශ්‍ර ක්‍රියා ප්‍රත්‍ය හඳුනාගෙන කියයි.
- මිශ්‍ර ක්‍රියා නිර්මාණය කරයි.
- මිශ්‍ර ක්‍රියා යොදමින් වාක්‍ය ලියයි, කියයි.

**විෂය කරුණුවල සංක්ෂිප්තය**

- ක්‍රියා මූලයට ഺ ഇ ഏ එක් කිරීමෙන් මිශ්‍ර ක්‍රියාව නිර්මාණය කළ හැකි බව
- මිශ්‍ර ක්‍රියාව ලිංග හා පුරුෂ භේදය අනුව වෙනස් නොවන බව
- අවසාන ක්‍රියාව සිදුවන අතර තුර මිශ්‍ර ක්‍රියාව සිදුවන බව

**යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය**

- උචිත ප්‍රවේශයකින් ආරම්භ කරන්න.
- මිශ්‍ර ක්‍රියා ප්‍රත්‍ය හඳුන්වා දෙන්න.
- මිශ්‍ර ක්‍රියා ප්‍රත්‍ය යොදා ක්‍රියා නිර්මාණය කරවන්න.
- මිශ්‍ර ක්‍රියා යොදා වාක්‍ය නිර්මාණය කිරීමට උපදෙස් දෙන්න.

**ගුණාත්මක යෙදවුම්**

- වගු සටහන්
- පරිශීලන ග්‍රන්ථ

**තක්සේරුව හා ඇගයීම සඳහා නිර්ණායක**

- මිශ්‍ර ක්‍රියා ප්‍රත්‍ය නම් කරයි.
- මිශ්‍ර ක්‍රියා යොදා ක්‍රියා නිර්මාණය කරයි.
- මිශ්‍ර ක්‍රියා යොදමින් වාක්‍ය නිර්මාණය කරයි.

**නිපුණතාව 5**

මූලික ව්‍යාකරණ රටා හඳුනාගෙන භාවිත කරයි.

**නිපුණතා මට්ටම**

5.1 ක්‍රියාපද භාවිත කරයි. (चाहिए)

**කාලච්ඡේද සංඛ්‍යාව 05**

**ඉගෙනුම් පල**

- අවශ්‍යතාවන් ප්‍රකාශ කිරීම සඳහා चाहिए යොදයි.
- කර්තෘ සමඟ को විභක්ති ප්‍රත්‍ය යොදයි.
- යුතුයි යන අදහස ප්‍රකාශ කිරීමට ක්‍රියානාමය සමඟ चाहिए යොදයි.
- නිෂේධාර්ථය ප්‍රකාශ කරයි.

**විෂය කරුණුවල සංක්ෂිප්තය**

- අවශ්‍යතාවන් සහ යුතුය යන අදහස ප්‍රකාශ කිරීම සඳහා चाहिए යෙදෙන බව
- चाहिए යෙදෙන විට කර්තෘට को විභක්තිය යෙදෙන බව
- ක්‍රියානාමයන් සමඟ ද चाहिए යෙදිය හැකි බව
- නිෂේධාර්ථය සඳහා नहीं යෙදිය යුතු බව

**යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය**

- උචිත ප්‍රවේශයකින් ආරම්භ කරන්න.
- चाहिए යෙදීමේ දී අනුගමනය කළ යුතු ව්‍යාකරණ රීති පැහැදිලි කරන්න.
- යුතුයි යන අදහස ප්‍රකාශ කිරීම සඳහා ද चाहिए යෙදෙන ආකාරය පැහැදිලි කර දෙන්න.
- සුදුසු අභ්‍යාසවල යොදවන්න.

**ගුණාත්මක යෙදවුම්**

- සංවාද
- හඬ පට
- පරිශීලන ග්‍රන්ථ

**තක්සේරුව හා ඇගයීම සඳහා නිර්ණායක**

- කර්තෘ සමඟ को නිවැරදි ව යොදයි.
- ක්‍රියා සමඟ चाहिए නිවැරදි ව යොදයි.
- නිෂේධාර්ථය ප්‍රකාශ කරයි.
- ප්‍රශ්න වාචක පද සමඟ चाहिए යොදයි.

**නිපුණතාව 5**

මූලික ව්‍යාකරණ රටා හඳුනාගෙන භාවිත කරයි.

**නිපුණතා මට්ටම**

5.1 ක්‍රියාපද භාවිත කරයි. (सकना)

**කාලච්ඡේද සංඛ්‍යාව 05**

**ඉගෙනුම් පල**

- ශක්‍යතාව ප්‍රකාශ කිරීම සඳහා सकना යොදයි
- කර්තෘ උක්ත රූපයෙන් තැබිය යුතු බව කියයි.
- කාලත්‍රයේ सकना භාවිතා කරයි.
- නිෂේධාර්ථය හා ප්‍රශ්නාර්ථයේ දී सकना යොදයි.

**විෂය කරුණුවල සංක්ෂිප්තය**

- सकना ක්‍රියා ධාතුවක් සමඟ පමණක් යෙදිය යුතු බව
- කාලත්‍රය අනුව වර නැගෙන්නේ सकना ක්‍රියාව පමණක් බව
- කර්තෘ උක්ත රූපයෙන් ම තැබිය යුතු බව
- අතීතයේ දී ने ප්‍රත්‍යය නොයෙදෙන බව

**යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය**

- උචිත ප්‍රවේශයකින් ආරම්භ කරන්න.
- सकना ක්‍රියා ධාතුවක් සමඟ යෙදෙන ආකාරය පැහැදිලි කරන්න.
- කාලත්‍රයේ වර නැගෙන ආකාරය විස්තර කරන්න.
- ශක්‍යාර්ථයේ දී සිංහලයේ කර්තෘ අනුක්ත වුවත් හින්දියේ එය උක්ත රූපයෙන් තැබිය යුතු බව පහදා දෙන්න.
- අතීතයේ දී ने ප්‍රත්‍යය නොයෙදෙන බව පැහැදිලි කරන්න.
- නිෂේධාර්ථයේ දී ක්‍රියා මූලයට පෙර नहीं යෙදෙන බව පැහැදිලි කරන්න.

**ගුණාත්මක යෙදවුම්**

- පරිශීලන ග්‍රන්ථ
- හඬපට
- වගු සටහන්

**තක්සේරුව හා ඇගයීම සඳහා නිර්ණායක**

- ක්‍රියා මූලය සමඟ सकना යොදයි.
- කර්තෘ උක්ත රූපයෙන් තබයි.
- කාලත්‍රයට නිවැරදි ව වරනඟයි
- නිෂේධාර්ථය නිවැරදි ව ප්‍රකාශ කරයි.
- ප්‍රශ්නාර්ථ වාක්‍ය නිර්මාණ කරයි.

නිපුණතාව 5

මූලික ව්‍යාකරණ රටා හඳුනාගෙන භාවිත කරයි.

**නිපුණතා මට්ටම**

5.2 අතීත කාලය නිවැරදි ව භාවිත කරයි. (සරල අතීතය, පවතින අතීතය)

**කාලච්ඡේද** සංඛ්‍යාව **05**

**ඉගෙනුම් පල**

- අතීත කාල සරල සහායක ක්‍රියා නම් කරයි.
- උක්තයේ ලිංග හා වචන භේදය අනුව අතීත කාල සහායක ක්‍රියාව වෙනස්වන බව කියයි.
- සරල අතීත කාල වාක්‍ය නිර්මාණය කරයි.
- පවතින අතීත කාල ක්‍රියා සාදයි.
- පවතින අතීත කාල වාක්‍ය නිර්මාණය කරයි.

**විෂය කරුණුවල සංක්ෂිප්තය**

- ආ, ඓ, ථි, ථී අතීත කාල සහායක ක්‍රියා බව
- උක්තය අනුව අඛ්‍යාතයේ සරල සහායක ක්‍රියාව යෙදිය යුතු බව

**යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය**

- උචිත ප්‍රවේශයකින් ආරම්භ කරන්න.
- අතීත සරල සහායක ක්‍රියා පැහැදිලි කරන්න.
- පවතින වර්තමාන කාලයේ වාක්‍යවල සහායක ක්‍රියාව වෙනුවට අතීත කාල සරල සහායක ක්‍රියා යොදන ආකාරය පැහැදිලි කර දෙන්න.
- වාක්‍ය නිර්මාණය කරවන්න.

**ගුණාත්මක යෙදවුම්**

- වගු සටහන්
- ශ්‍රව්‍ය දෘශ්‍ය ආධාරක
- පරිශීලන ග්‍රන්ථ

**තක්සේරුව හා ඇගයීම සඳහා නිර්ණායක**

- අතීත කාල සරල සහායක ක්‍රියා තෝරයි.
- සහායක ක්‍රියා සුදුසු පරිදි යොදයි.
- පවතින වර්තමාන කාල වාක්‍ය ප්‍රවර්තන අතීතයට හරවයි.
- පවතින අතීත කාල වාක්‍ය නිර්මාණය කරයි.

**නිපුණතාව 5**

මූලික ව්‍යාකරණ රටා හඳුනාගෙන භාවිත කරයි.

**නිපුණතා මට්ටම**

5.2 අතීත කාලය නිවැරදි ව භාවිත කරයි. (සාමාන්‍ය අතීත කාලය)

**කාලච්ඡේද සංඛ්‍යාව 05**

**ඉගෙනුම් පල**

- අතීත කාල ක්‍රියා රූප ගොඩ නගයි.
- ලිංග සහ වචන භේදය අනුව ක්‍රියාව වරනගයි.
- අතීත කාල ක්‍රියා අකර්මක, සකර්මක වශයෙන් වර්ග කරයි.
- ने ප්‍රත්‍යය නිවැරදි ව යොදයි.
- අතීත කාල ක්‍රියාව නිවැරදි ව භාවිත කරයි.

**විෂය කරුණුවල සංක්ෂිප්තය**

- ව්‍යඤ්ජනාන්ත ක්‍රියාමූල සමඟ आ ප්‍රත්‍යය ද, ස්වරාන්ත ක්‍රියා මූල සමඟ या ප්‍රත්‍යය ද එක්වන බව
- जाना, लेना, देना, पीना, करना, होना යන ක්‍රියාවට අතීත කාල ක්‍රියා නිර්මාණය ඉහත රීතින්ට අනුගත නොවන බව
- අතීත කාලයෙන් අදහස් ප්‍රකාශ කිරීමේ දී ක්‍රියාපදයේ අකර්මක, සකර්මක, භේදය හඳුනා ගත යුතු බව
- සකර්මත ක්‍රියා සහිත වාක්‍යවල කර්තෘට ने ප්‍රත්‍යය යෙදෙන බව සහ අකර්මක ක්‍රියා සහිත වාක්‍යවල කර්තෘ ට ने ප්‍රත්‍යය නොයෙදන බව
- සකර්මක වුවත් बोलना, भूलना, समझना, लाना ක්‍රියා සමඟ ने ප්‍රත්‍යය නොයෙදන බව
- खाँसना, छींकना, नहाना ක්‍රියා අකර්මක වුවත් ने ප්‍රත්‍යය යෙදෙන බව
- අකර්මක ක්‍රියා සහිත වාක්‍යවල කර්තෘට අනුව ආඛ්‍යාතය තැබිය යුතු බව
- සකර්මක ක්‍රියා සහිත වාක්‍යවල කර්මයට අනුව ආඛ්‍යාතය තැබිය යුතු බව

**යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය**

- උචිත ප්‍රවේශයකින් ආරම්භ කරන්න.
- අතීත කාල ක්‍රියා නිර්මාණයේ රීති පැහැදිලි කර දෙන්න.
- ලිංග හා වචන භේදය අනුව ක්‍රියා රූපය වරනැගෙන ආකෘතිය අවබෝධ කරවන්න.
- ක්‍රියා පදවල අකර්මක, සකර්මක භේදය හඳුන්වා දෙන්න.
- අකර්මක ක්‍රියා භාවිත කරමින් අතීත කාල වාක්‍ය නිර්මාණය කරවන්න.
- සකර්මක ක්‍රියා භාවිත කරමින් අතීත කාල වාක්‍ය නිර්මාණය කරවන්න.

**ගුණාත්මක යෙදවුම්**

- වගු සටහන්
- ශ්‍රව්‍ය දෘශ්‍ය ආධාරක
- පරිශීලන ග්‍රන්ථ

**තක්සේරුව හා ඇගයීම සඳහා නිර්ණායක**

- ක්‍රියා නාමවලින් අතීත කාල ක්‍රියා නිර්මාණය කරයි.
- ලිංග හා වචන භේදය අනුව ක්‍රියා පද වරනගයි.
- නාම හා සර්වනාම සමඟ ने ප්‍රත්‍යය යොදයි.
- සදොස් වාක්‍ය නිදොස් කරයි.

**නිපුණතාව 5**

මූලික ව්‍යාකරණ රටා හඳුනාගෙන භාවිත කරයි.

**නිපුණතා මට්ටම**

5.3 අව්‍ය පද භාවිත කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** 04

**ඉගෙනුම් පල**

- නාම පද සහ සර්වනාම පද සමඟ අව්‍ය පද යොදයි.
- ක්‍රියා පද සමඟ අව්‍ය පද භාවිත කරයි.
- අව්‍ය පද භාවිත කරමින් වාක්‍ය සම්බන්ධ කරයි.

**විෂය කරුණුවල සංක්ෂිප්තය**

- ආකාරාන්ත පුරුෂ ලිංග නාම පද සමඟ සම්බන්ධ සූචක් අව්‍ය පද එක්වීමේ දී නාම පදයේ 'ආ' ස්වරය 'ඒ' ස්වරයට පරිවර්තනය වන බව
- සර්ව නාම පද සමඟ සම්බන්ධ සූචක් අව්‍ය පද එක්වීමේ දී සර්වනාමයේ රූපය වෙනස් වන බව
- සම්බන්ධසූචක් අව්‍ය පද ක්‍රියා නාමයේ පුරුෂ ලිංග බහු වචන රූපය සමඟ එක්වන බව
- සමුච්චයබෝධක් අව්‍ය පද බොහෝ විට වාක්‍ය සම්බන්ධ කිරීමේ දී යෙදෙන බව

**යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය**

- උචිත ප්‍රවේශයකින් ආරම්භ කරන්න.
- සම්බන්ධ සූචක් හා සමුච්චය බෝධක් අව්‍ය පද හඳුන්වා දෙන්න.
- නාම පද සහ ක්‍රියා පද සමඟ අව්‍ය පද යෙදෙන ආකාරය පැහැදිලි කර දෙන්න.
- සුදුසු ක්‍රියාකාරකම්වල යොදවන්න.

**ගුණාත්මක යෙදවුම්**

- ශ්‍රව්‍ය දෘශ්‍ය ආධාරක
- පරිශීලන ග්‍රන්ථ
- අන්තර්ජාලය

**තක්සේරුව හා ඇගයීම සඳහා නිර්ණායක**

- අව්‍ය පද තෝරයි.
- හිස් තැන්වලට සුදුසු අව්‍ය පද යොදයි.
- නාම සර්වනාම හා ක්‍රියා පද සමඟ අව්‍ය පද යොදයි
- අව්‍ය පද යොදා වාක්‍ය නිර්මාණය කරයි.

**නිපුණතාව 6**

හින්දියෙන් ගණන් කරයි.

**නිපුණතා මට්ටම**

6.1 ක්‍රමාංක සංඛ්‍යා ගණන් කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව 02**

**ඉගෙනුම් පල**

- 1-10 දක්වා ක්‍රමාංක සංඛ්‍යා ප්‍රකාශ කරයි.
- 1-10 දක්වා ක්‍රමාංක සංඛ්‍යා විශේෂණ ලෙස භාවිත කරයි.
- 1-10 දක්වා ක්‍රමාංක සංඛ්‍යා යොදා වාක්‍ය ගොඩ නගයි.

**විෂය කරුණුවල සංක්ෂිප්තය**

- पहला, दूसरा, तीसरा, चौथा, पाँचवाँ, छठा, सातवाँ, आठवाँ, नवाँ, दसवाँ ක්‍රමාංක සංඛ්‍යා බව
- විශේෂණයක් ලෙස යෙදෙන විට ලිංගය හා වචනය අනුව ක්‍රමාංක වෙනස් වන බව

**යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය**

- උචිත ප්‍රවේශයකින් ආරම්භ කරන්න.
- 1-10 දක්වා ක්‍රමාංක සංඛ්‍යා හඳුන්වන්න.
- විශේෂණයක් ලෙස යෙදෙන විට විශේෂ්‍යය අනුව ක්‍රමාංක සංඛ්‍යා වෙනස්වන ආකාරය පැහැදිලි කර දෙන්න.
- සුදුසු අභ්‍යාසවල යොදවන්න.

**ගුණාත්මක යෙදවුම්**

- ශ්‍රව්‍ය දෘශ්‍ය ආධාරක
- වගු සටහන්

**තක්සේරුව හා ඇගයීම සඳහා නිර්ණායක**

- 1-10 ක්‍රමාංක සංඛ්‍යා දක්වයි.
- යෝග්‍ය ක්‍රමාංක රූපය තෝරයි
- සදොස් වාක්‍ය නිදොස් කර ලියයි.
- ක්‍රමාංක සංඛ්‍යා යොදා වාක්‍ය නිර්මාණය කරයි.

**නිපුණතාව 6**

හින්දියෙන් ගණන් කරයි.

**නිපුණතා මට්ටම**

6.2 හින්දියෙන් වෙලාව ප්‍රකාශ කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව 02**

**ඉගෙනුම් පල**

- පූර්ණ සංඛ්‍යා භාවිත කරමින් වෙලාව කියයි.
- අපූර්ණ සංඛ්‍යා භාවිත කරමින් වෙලාව කියයි.
- වෙලාව විමසීමේ දී වාක්‍ය රටා හඳුනාගෙන භාවිත කරයි.

**විෂය කරුණුවල සංක්ෂිප්තය**

- වෙලාව දැක්වීමේ දී बजे යන පදය සංඛ්‍යාවට පසුව යෙදිය යුතු බව
- වෙලාව විමසීමේ ක්‍රම කිහිපයක් ඇති බව
- 1.30, 2.30, 1.15 යන වේලාවන් සඳහා විශේෂ යෙදුම් භාවිත වන බව
- වෙලාව ප්‍රකාශ කිරීමේදී आधा සහ पाव යන වචන භාවිත නොවන බව

**යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය**

- උචිත ප්‍රවේශයකින් පාඩම ආරම්භ කරන්න.
- වෙලාව විමසීමේ වාක්‍ය රටා හඳුන්වා දෙන්න.
- ඔරලෝසුවක් ආධාරයෙන් පූර්ණ සහ අපූර්ණ සංඛ්‍යා ප්‍රායෝගික ව හඳුන්වා දෙන්න.
- පැය සහ විනාඩි වශයෙන් වෙලාව ප්‍රකාශ කිරීමේ ක්‍රම හඳුන්වා දෙන්න.
- ඔරලෝසුවක ආධාරයෙන් වෙලාව විමසන්න.
- සුදුසු අභ්‍යාස ලබා දෙන්න.

**ගුණාත්මක යෙදවුම්**

- ශ්‍රව්‍ය දෘශ්‍ය ආධාරක

**තක්සේරුව හා ඇගයීම සඳහා නිර්ණායක**

- වෙලාව විමසයි.
- පූර්ණ සංඛ්‍යා සහිත ව වෙලාව දක්වයි.
- අපූර්ණ සංඛ්‍යා භාවිත කරමින් වෙලාව දක්වයි.
- පැය සහ විනාඩි වශයෙන් වෙලාව දක්වයි.

නිපුණතාව 6

හින්දීයෙන් ගණන් කරයි.

**නිපුණතා මට්ටම**

6.3 හින්දීයෙන් මිණුම් දක්වයි

**කාලච්ඡේද සංඛ්‍යාව 02**

ඉගෙනුම් පල

- 1 සිට 100 දක්වා ගණන් කරයි.
- 250, 500, 750, 1000 වැනි මිණුම් දැක්වීමේ දී භාවිත වන විශේෂ සංඛ්‍යා හඳුනාගෙන යොදයි.
- බර, ද්‍රව, දිග සහ මුදල් සඳහා වන සම්මත මිණුම් ඒකක හඳුනාගෙන යොදයි.
- පූර්ණ සංඛ්‍යා සහිත ව බර, ද්‍රව, දිග සහ මුදල් ප්‍රකාශ කරයි.
- අපූර්ණ සංඛ්‍යා සහිත ව බර, දිග, ද්‍රව මුදල් ප්‍රකාශ කරයි.

විෂය කරුණුවල සංක්ෂිප්තය

- බර, දිග, සහ ද්‍රව මැනීමේ දී භාවිත කරන आधा, पाव, पौने යන යෙදුම් මුදල් සඳහා භාවිත නොවන බව

**යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය**

- උචිත ප්‍රවේශයකින් පාඩමට ප්‍රවේශ වෙන්න.
- 1 සිට 100 දක්වා පූර්ණ සංඛ්‍යා පන්තියේ ප්‍රදර්ශනය කරන්න.
- සිසුන්ට ගණන් කර පෙන්වන්න.
- සිසුන් ලවා ගණන් කරවන්න.
- 200, 250, 300, 400 ලෙස පූර්ණ සංඛ්‍යා ඉදිරියට ගණන් කරන ආකාරය පැහැදිලි කර දෙන්න.
- බර, දිග, ද්‍රව සහ මුදල් මැනීමේ ඒකක පැහැදිලි කර දෙන්න.
- සිසුන් කණ්ඩායම්වලට බෙදා, බඩු ලැයිස්තුවක් මිල ගණන් සහිත ව සකස් කිරීමට උපදෙස් දෙන්න.
- එක් එක් කණ්ඩායමට සංවාදයක් ආකාරයෙන් නිරූපණය කිරීමට උපදෙස් දෙන්න.

ගුණාත්මක යෙදවුම්

- ශ්‍රව්‍ය දෘශ්‍ය ආධාරක

**තක්සේරුව හා ඇගයීම සඳහා නිර්ණායක**

- මිල ගණන් සහිත ව බඩු ලැයිස්තුවක් සකස් කිරීම.
- සංවාදයක ආකාරයට පන්තියට ඉදිරිපත් කිරීම.
- සුදුසු මිණුම් ඒකක යොදා වාක්‍ය සම්පූර්ණ කිරීම.

**නිපුණතාව 7**

කියවා ප්‍රතිචාර දක්වයි.

**නිපුණතා මට්ටම**

7.1 කියවා අර්ථය අවබෝධ කර ගනියි.

**කාලච්ඡේද සංඛ්‍යාව 04**

**ඉගෙනුම් පල**

- ගද්‍ය/පද්‍ය පාඨ කියවා දුරවබෝධ පදවල අර්ථය විමසා දැන ගනියි.
- ගද්‍ය/පද්‍ය පාඨ පංතිය කියවා පිළිතුරු සපයයි.
- සමානාර්ථ පද ලියයි.
- විරුද්ධාර්ථ පද ලියයි.

**විෂය කරුණුවල සංක්ෂිප්තය**

- දෙන ලද ගද්‍ය/පද්‍ය කොටස අවබෝධයෙන් කියවිය යුතු බව
- ගද්‍ය/පද්‍ය කියවීමෙන් වාග් කෝෂය පුළුල් වන බව
- තොරතුරු ලබා ගැනීම සඳහා ගද්‍ය/පද්‍ය පාඨ කියවිය යුතු බව

**යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය**

- උචිත ප්‍රවේශයකින් පාඩමට ප්‍රවේශ වෙන්න.
- අදාළ ගද්‍ය, පද්‍ය පාඨය කියවීමට අවස්ථාව ලබා දෙන්න.
- දුරවබෝධ පදවල අර්ථය පැහැදිලි කර දෙන්න.
- අර්ථාවබෝධය පහසු කිරීම සඳහා ප්‍රශ්න විමසන්න.
- ප්‍රශ්නාවලියක් ලබා දී පිළිතුරු ලිවීමට /සෙවීමට යොමු කරන්න.
- පිළිතුරු සාකච්ඡා කරන්න.

**ගුණාත්මක යෙදවුම්**

- ගද්‍ය/පද්‍ය පාඨ

**තක්සේරුව හා ඇගයීම සඳහා නිර්ණායක**

- ගද්‍ය/ පද්‍ය කියවා පිළිතුරු සපයයි.
- දී ඇති පදවලට සමානාර්ථ පද තෝරා ලියයි.
- ඡේදයට අදාළ ව දී ඇති ප්‍රකාශවල හරි, වැරදි ලකුණු කරයි.

**නිපුණතාව 7**

කියවා ප්‍රතිචාර දක්වයි.

**නිපුණතා මට්ටම**

7.2 චිත්‍ර සටහන් විස්තර කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව 06**

**ඉගෙනුම් පල**

- දී ඇති චිත්‍රය දෙස බලා අසන ලද ප්‍රශ්නවලට වාචිකව පිළිතුරු දෙයි.
- චිත්‍රය දෙස බලා පිළිතුරු ලකුණු කරයි.
- චිත්‍ර දෙස බලා අදහස් ප්‍රකාශ කරයි.
- අදහස් ප්‍රකාශ කිරීමේ දී වියරණ නිවැරදි ව භාවිත කරයි.

**විෂය කරුණුවල සංක්ෂිප්තය**

- චිත්‍රය විස්තර කිරීමේ දී පින්තූරය හොඳින් නිරීක්ෂණය කළ යුතු බව
- නිවැරදි වියරණය භාවිතයෙන් චිත්‍රය විස්තර කළ යුතු බව

**යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය**

- අදාළ චිත්‍රය පන්තියට ඉදිරිපත් කරන්න.
- එය පිළිබඳ ව සිසුන්ගෙන් ප්‍රශ්න විමසන්න.
- වාචිකව පිළිතුරු ලබා ගන්න.
- ප්‍රශ්නාවලියක් සිසුන්ට ලබාදී චිත්‍රය ආධාරයෙන් නිවැරදි පිළිතුරු ලකුණු කරවන්න.
- පිළිතුරු සාකච්ඡා කරන්න.

**ගුණාත්මක යෙදවුම්**

- චිත්‍ර සටහන්

**තක්සේරුව හා ඇගයීම සඳහා නිර්ණායක**

- චිත්‍රය කියවා අසන ප්‍රශ්නවලට වාචික ව පිළිතුරු සපයයි.
- චිත්‍රය කියවා අසන ප්‍රශ්නවලට ලිඛිත ව පිළිතුරු සපයයි.

**නිපුණතාව 8**

පරිවර්තනය කරයි.

**නිපුණතා මට්ටම**

8.1 හින්දි වාක්‍ය සිංහල/දෙමළ/ඉංග්‍රිසි භාෂාවට පරිවර්තනය කරයි.

8.2 සිංහල /දෙමළ/ඉංග්‍රිසි වාක්‍ය හින්දි භාෂාවට පරිවර්තනය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** 14

**ඉගෙනුම් පල**

- දී ඇති හින්දි ඡේදය සිංහල/දෙමළ/ඉංග්‍රිසි භාෂාවට පරිවර්තනය කරයි.
- දී ඇති සිංහල/දෙමළ/ඉංග්‍රිසි ඡේදය හින්දියට පරිවර්තනය කරයි.
- ලක්ෂ්‍ය භාෂාවේ වාක්‍ය රීතීන්ට අනුගතව වාක්‍ය පරිවර්තනය කරයි.
- දී ඇති ඡේදයේ කාල භේදය සැලකිල්ලට ගෙන පරිවර්තනය කරයි.

**විෂය කරුණුවල සංක්ෂිප්තය**

- පරිවර්තනය සඳහා ලබා දී ඇති ඡේදය අවබෝධයෙන් යුතු ව කියවිය යුතු බව
- දී ඇති ඡේදයේ කාලයට අනුගතව පරිවර්තනය කළ යුතු බව
- ලක්ෂ්‍ය භාෂාවේ ව්‍යාකරණ රටාව හා වාක්‍ය රටාව පිළිබඳ ව සැලකිලිමත් විය යුතු බව

**යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය**

- සරල ගද්‍යාංශයක් සිසුන්ට ලබා දෙන්න.
- ගද්‍යාංශයේ දුරවබෝධ පදවල අර්ථය පැහැදිලි කර දෙන්න.
- පරිවර්තනයක දී සැලකිල්ලට ගත යුතු රීතින් පිළිබඳ ව අවබෝධ කර දෙන්න.
- යෝග්‍ය ක්‍රියාකාරකම්වල යොදවන්න.
- පිළිතුරු සාකච්ඡා කරන්න.

**ගුණාත්මක යෙදවුම්**

- ගද්‍ය පාඨ

**තක්සේරුව හා ඇගයීම සඳහා නිර්ණායක**

- හින්දි ඡේදයක් සිංහල/දෙමළ/ඉංග්‍රිසියට පරිවර්තනය කරයි.
- සිංහල / දෙමළ /ඉංග්‍රිසි ඡේදයක් හින්දියට පරිවර්තනය කරයි.
- ව්‍යාකරණ රීති හා වාක්‍ය රීති නිවැරදි ව භාවිත කරයි.

## ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය ප්‍රවර්ධනය කිරීමේ නිදර්ශක ආධාරකය

1. පාසල් වාරය : පළමුවන වාරය

2. ආධාරක අංකය : 01

3. ආවරණය කෙරෙන නිපුණතා මට්ටම් : 2.1, 2.2

4. ආවරණය කෙරෙන විෂය සන්ධාරය :
   - ස්වර පිල්ලම් නිවැරදි ව ලියයි.
   - සංයුක්ත ව්‍යඤ්ජන නිවැරදි ව ලියයි.
   - ශිරෝ රේඛාව නිවැරදි ව භාවිත කරයි.
   - හින්දී වචන නිවැරදි ව ලියයි
   - සරල හින්දී වාක්‍ය නිවැරදි ව ලියයි.

5. ආධාරකයේ ස්වභාවය :
   - ලිඛිත පරීක්ෂණයක්

6. ආධාරකයේ අරමුණු
   - ස්වර පිල්ලම් නිවැරදි ව යෙදීමට හුරු කිරීම.
   - සංයුක්ත අක්ෂර නිවැරදි ව යෙදීමට හුරු කිරීම.
   - හින්දී වචන නිවැරදි ව ලිවීමට හුරු කිරීම.
   - සරල හින්දී වාක්‍ය නිවැරදි ව ලිවීමට හුරු කිරීම

7. ආධාරකය ක්‍රියාත්මක කිරීමට උපදෙස් :

*ගුරු භවතුන් සඳහා උපදෙස්*

- අල්පප්‍රාණ, මහාප්‍රාණ අක්ෂර, ස්වර පිල්ලම් සහ සංයුක්ත අක්ෂර සහිත සරල ගද්‍ය පාඨයක් සුදුසු ක්‍රමයක් භාවිත කරමින් සිසුන්ට ලබා දෙන්න.

- ඒ ඇසුරින් ස්වර පිල්ලම්, අල්පප්‍රාණ, මහප්‍රාණ අක්ෂර සහ සංයුක්ත අක්ෂර නිවැරදි ව භාවිත කරමින් වචන නිවැරදි ව ලිවීම, සරල වාක්‍ය නිවැරදි ව ලිවිම ආදිය තහවුරු වන පරිදි සිසුන් කේවල ව අභ්‍යාසවල නිරත කරවන්න.

*සිසුන් සඳහා උපදෙස්*

- දී ඇති උපදෙස් මැනවින් අනුගමනය කරමින් අභ්‍යාසයෙහි නිරත වන්න.

8. ඇගයීම් ක්‍රමය:

| සිසුන්ගේ නම් / නිර්ණායක | අල්පප්‍රාණ සහ මහප්‍රාණ අක්ෂර , ස්වර පිල්ලම් නිවැරදි ව ලියයි | සංයුක්ත අක්ෂර නිවැරදි ව යොදයි | වචන නිවැරදි ව ලියයි | වාක්‍ය නිවැරදි ව ලියයි | කාල කළමනාකරණය | එකතුව |
|---|---|---|---|---|---|---|
| | | | | | | |

**ලකුණු පරාසය**

ඉතා හොඳයි - 04

හොඳයි - 03

මධ්‍යස්ථයි - 02

සංවර්ධනය විය යුතුයි - 01